

# (අ)හිමි සිත්තම්



ආර්.එම්.සඳලි තාරකා රත්නායක

# (අ)හිමි සිත්තම්


## ආර්.එම්.සඳලි තාරකා රත්නායක


**කතෘගේ වෙනත් කෘති**

- අද්භූත මායා තොප්පිය
- අන්ධකාරයේ සෙවණැලි


මහාමායා බාලිකා විද්‍යාලය
11-C



2026.05.10

978-624-211-437-8

# පිදුම...!

මතකයන් මැකී ගියද

හදවතේ ලියැවුණු සුන්දර බැඳීම්

අමතක නොවන බව

විශ්වාස කරන

සියලු දෙනාටම

ආදරයෙන් පුදමි...

## ~සෙනෙහසින් තුති පුදමි~

අධ්‍යාපන කටයුතු මධ්‍යයේ වුවද නිර්මානකරණයෙහි යෙදීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුන් මාගේ ආදරණීය දෙමාවුපියන්ටත්,

ගුණ දොස් දක්වමින් මා දිරිමත් කල ඥාතීන් ඇතුලු සියලුම අයටත්,

ඕනෑම මොහොතක මා තනි නොකර මගේ ළඟින්ම සිටි මාගේ ආදරණීය මිතුරන්ටත්,

මෙසේ තුති පුදමි...!

ස්තූතියි
ඔබ සැමට!!!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා ග්‍රන්ථ උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කල හැකිය.දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අද්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සෙ වැඩම කර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ඉතූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණ ශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතු වීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව.<br>
2026.05.1

# 01.

*To really love a woman…*

*To understand her…*

*You gotta know her deep inside…*

*Hear every thought…*

*See every dream…*

*And give her wings when she wants to fly….*

*Then when you find yourself layin' helpless in her arms…*

*You know you really love a woman…*

නොපෙනෙන මානයකින් ඇසුනේ කවුරුන් හෝ කරන වයලින් වාදනයකි. ශාලාව ඉතාමත් සෝෂාකාරීය. ඉර උදා වී තවමත් එතරම් වේලාවක් ගත වී නොතිබුණද ලා හිරු රැස් ශාලාව දැනටමත් වෙලා ගෙන තිබුණි. කඩිමුඩියේ ශාලාව තුල එහා මෙහා ගමන් කරන මිනිසුන් තම චිත්‍ර තමාට වෙන්කරන ලද ස්ථානයට රැගෙන යාමට දැඩි වෙහෙසක් දරයි. විවිධාකාර වූ සිතුවම්වලින් පිරි දිගු ශාලාව හදිස්සියේ එහා මෙහා ගමන් හැසිරෙන මිනිසුන්ගෙන් සල්පිලක් මෙන් පෙනුණි. ඇතැම් සිතුවම් දැනටමත් තමාට වෙන්කර ඇති තැන්වල වැජඹෙමින් පවතී. චිත්‍ර ප්‍රදර්ශන ශාලාව ශ්වේත වර්ණ

ගඩොල් බිත්ති අතරින් ලා රිදී පැහැති දිස්නයක් ගෙන දුන්නේය. සුදු පැහැති බිත්තියේ තැන් තැන්වල එල්ලා තිබුණු සිතුවම් මතක සමුදායක දර්ශනයක් ගෙන දුන්නේය. රුධිරය වැනි රක්ත වර්ණය ආලය, රාගය වැනි සිතුවිලි මවා පෑවේය. අහස් නිල නිසංසල බවත්, අලු වර්ණය නිශ්ශබ්දතාවත් හෙළි කලේය. සිහින් සිනා හඬත්, සිත්තරුන් එකිනෙකා අතර සිදුකරන මැසිවිලි නැගීම්, ශාලාව හරහා ඇවිදයන්නන්ගේ අඩි ශබ්දත් වාතයට මුසු වී අවට නිහඬබව බිඳහෙලුවේය. ඒ අතර කොහේ හෝ සිට ඇසෙන නාඳුනන්නෙකුගේ මෘදු වයලින් වාදනයක්ද වාත අංශු අතරින් පැතිරී ගියේ කනට මී පැණි වත්කරනවා හා හැඟීමක්ද එකතු කරමින් ය.

ඒ අතර ශවුර්යා ශාලාව දිගේ සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදුනේ ඇගේ සෙරෙප්පු අඩි කලු පිඟන් ගඩොල් පොළොවේ හප්පමින් සියුම් හඬක්ද නගමිනි. ඇගේ සම රන්වන් පැහැතිය. කාලවර්ණ හිසකෙස් එකතු කර සියුම් ලෙස රිබන් පටියකින් ගැටගසා තිබුණද ඇගේ හිසකෙස් උරහිස හරහා පහලට කඩා හැලුණි. ලැවෙන්ඩර් වර්ණයෙන් යුතු සුදු පාට මල් එම්බ්‍රොයිඩර් කරන ලද ගවුමකින් සැරසී සිටි ඇය දෙව්ලොව සිට මනුලොවට වැඩි සුර අඟනක් වැනිය. කෝපි පාට ඒ අහංකාර ඇස්, දිග ඇස් පිහාටු හරියට දෙවියන් මැව් රූපයක් වැනිය. ඒ ඇස් කියාගන්න බැරි හැඟීම් දහසක් අතර සිරවී සිටියේ හරියට කවදාවක් අමතක කල නොහැක්කක් රහසේ සිරකරගෙන සිටිනවා වැනිය. හිනාවෙන කොට වලගැහෙන කම්මුල්... ඇත්තටම ඒවා ඇගේ ලස්සන තවත් වැඩි කලේය.

ශවුර්යා අන්තිම පාරට චිත්‍ර ප්‍රදර්ශනයකට සහභාගී වුනේ දැනට අවුරුදු හතරකට කලින්. ශවුර්යා අන්තිම පාරට යමක් සිතුවමට නැගුවේද මීට අවුරුදු හතරකට පෙරය. ගෙවී ගිය අවුරුදු හතරක කාලය පුරාම පින්සලක් අතින් වත්

නොඇල්ලූ ශවුර්යා ඇය තමාට විටින් විට නාඳුනන්නෙකුගෙන් ලැබුණු විචිත්‍රවත් සිතුවම් පරිස්සම් කොට තමා ලගම තියාගෙන සිටියේ අද දවස වෙනකල් ය. බොහෝ පිරිසකගේ ඉල්ලීම් මත ශවුර්යා චිත්‍ර ප්‍රදර්ශනය ඉතා උත්කර්ශවත් විදියට සැලසුම් කලත් ඇය තමන්ගේ එකදු සිතුවමක් වත් එයට ඉදිරිපත් නොකලේ තමන් වැඩියෙන්ම ආදරය කල ඒ යෞවනයා තමාට අහිමි වූ පසු ඇය කිසිවක් සිතුවම් නොකල නිසාය.

ආදරය කියන අකුරු හතර වර්ණ එකින් එක හරි ලස්සනට එකතු කරලා සිතුවමට නැගිය හකි බවත් වර්ණවලට කතා කලහැකි බවත් ඇයට ඉගැන්නූ ඔහු... ආදරය යනු කැන්වස් රෙද්දකට පමණක් සීමා නොකල ඊට එහා දෙයක් ඇයට කියාදුන් ඒ සුන්දර පිරිමි ආත්මය... ඒ කළු ඇස් හිමි අහංකාර යෞවනයා... ඇයට අහිමි වී දැනට අවුරුදු හතරක්ම ගෙවී ගොසින්ය. අවුරුදු හතරක් පුරාවටම ඇසින් වත් නොදැකපු ඔහු ගැන තිබූ ආලය ශවුර්යාගේ සිතෙහි තවමත් එහෙම්මය.

“ ශවුර්යා ඔයා මේක හරි ලස්සනට organize කරලා තියෙනවා. ඒත්... මට දුකයි ඔයා ඔයාගේ එක චිත්‍රයක්වත් මේකට ඉදිරිපත් කරේ නැති එකට ” ශවුර්යාගේ හොදම යාලුවා, එලීෂා එහෙම කිව්වේ ශවුර්යා ඇය පහුකරන් යද්දීමය.

ශවුර්යා මදකට නැවතුනේ ඇයට පිලිතුරු දෙන්නයි. “ ඔව් ඒක ඇත්ත... ඒත් ඔයා දන්නවනේ එලීෂා මන් එදා ඉදලා අද වෙනකල්ම තාම එක චිත්‍රයක් වත් ඇන්දේ නෑ කියලා...මන් මේ exhibition එක organize කලේ මන් වෙනුවෙන් නෙමෙනේ... ඔයලා හැමෝම වෙනුවෙන් ”

ඒලීෂාට ටික වෙලාවකට සමුදුන්න ශවුර්යා ඉස්සරහටම ඇවිදන් ගියාය.

ශාලාවේ දෙපැත්තෙහි තබා ඇති කැන්වස් රාමු දෙස මාරුවෙන් මාරුවට දෑස් යොමුකල ඇය ශෝකය පිරුණු සතුටක් හිතට නගා ගත්තාය. තමාගේ පලමු චිත්‍ර ප්‍රදර්ශනයට නන්දෙසින් පැමිණි සිත්තරුන් ලහිලහියේ සූදානම් වෙති. ඒ ගැන ඇය තුල වූයේ ඉමහත් ප්‍රීතියකි. ඒත්... ඇය අලුතින් සිතුවම් කල එකදු සිතුවමක්වත් මෙහි නැත. ඒ ගැන ඇය තුල වූයේ මහත් කණගාටුවකි. ඒ කොහොම වුවද කණගාටුවද ප්‍රීතියද මුසු වුණු සිතින් යුතු ඇය පැමිණ සිටියවුන්ට සිහින් සිනාවකින් සංග්‍රහ කරමින් ඉදිරියට ගියාය. එයින් බොහෝ අය ඇගේ විශ්වවිද්‍යාලයේ පැරණි මිතුරන් ය. ඒ හැමෝම දැන් දක්ෂ සිත්තරුන් වී හමාරය. තවත් සමහරුන් තම රැකියාව ලෙස සිතුවම් අලෙවිකරමින් මුදල් ඉපැයූහ. පැමිණ සිටි අයගෙන් තවත් සමහරෙක් ඇයට අන්තර්ජාලයෙන් හමුවූ මිතුරන් ය. ඒ කොහොම වුවත් ඒ හැමෝගෙම නෙක නෙක සිතුවම් වලින් ශාලාව අලංකාර කර තිබුණේය.

ඇගේ ඇස් කැන්වස් රාමු එකට යොමු වී ශාලව කෙළවරෙහි වූ එක් සිතුවමක ඇගේ ඇස් මොහොතකට නතර විය. එය අනෙක් සිතුවම්වලට වඩා වෙනස් එකක් විය. අලු පැහැය මිශ්‍ර ගැඹුරු මුහුදු නිලකින් සිතුවම් කරන ලද සිහින් පොද වැස්සක අතරමං වූ බොඳ වුණු කාන්තාවකගෙ හා පිරිමියෙකුගේ රුවක් පිළිඹිබු කලේය. තත්පර කිහිපයකට ශවුර්යා ඇගේ දෑස් එයින් ඉවතට නොගත්තාය. මෙහි ඇති කුමක් හෝ හුරුපුරුදු බවක් ඇයට දනුණි. ඒත් ඒ මොකද්ද...? වටහාගත නොහැකි කිසියම් වූ හැඟීමක් දැනටමත් ඇගේ හදවත වෙලාගෙන අවසන් ය.

ඇගේ හෘද ස්පන්ධනය තවත් වැඩි විය. හුරුපුරුදු නමුත් නොදන්නා යමක් ඇයට දැනුණේය... ඇගේ කෙස් සුළං පොදත් සමග දබර කලේ මේ එයට අවස්ථාව නොවේ යැයි ඇය සිතින් සිතින අතරතුරය.

ඒත් සමගම සිහින් අඩි ශබ්දයක් ඇයට පිටුපසින් ඇසුණි. ඇගේ හදවත එක් මොහොතකට අක්‍රිය විය. ඇගේ හිත ඉතාමත් නොසන්සුන් ය. සිදුවන්නේ කුමක්දැයි කියා ඇයට කිසිදු නිනව්වක් නොමැත. ඇයට එක්වරම මතක් වුණේ තමන් දැනටමත් චිත්‍රය දිහා විනාඩි පහකටත් වැඩියෙන් බලා සිට ඇති බවයි. ඇයට නැවතත් පියවි සිහියට පැමිණියාය.

එක්වරම කවුරුන් හෝ ඇගේ උරහිස මත අතක් තැබුවේය. ඇයට දැනුණේ තමා ගල් ගැසී ඇති බවකි. ඇගේ හිසේ සිට දෙපතුල දක්වාම විදුලියක් ගමන් කරනවාක් මෙන් ශවුර්යාට දැනුණි. සීතල සුළං රැල් ඇයව සිපගත්තේද අහඹුලෙසය.

“ ශවුර්යා ...? ” පිටුපසින් ඇසුණේ හුරුපුරුදු නමුත් අමතක වී ගිය කටහඬකි. එය වෙව්ලනසුලු විය... එමෙන්ම අවිනිශ්චිතය...

ශවුර්යාට දැනුණේ ඇගේ දෑත් සීතල වී ඇති බවකි. ඇය සෙමෙන් පිටුපසට හැරුණාය. එකායි... දෙකායි... තුනායි... එක් ක්ෂණයකින් ඔවුන්ගේ දෑස් හමුවිය...ඈතින් ඇසුණු වයලීන් වාදනය දැන් නතර වී ගොසින් ය. පැමිණ සිටින මිනිසුන්ගෙන්ද කිසිදු හඬක් නැගෙන්නේද නැත. පාරේ යන වාහනවල හඬ පවා දැන් මැකී ගොසින් ය... සීතල සුළඟ ඇයව පසාරු කරගෙන ගියද ඇයට ඒ පිළිබඳවත් සිහියක් නොවිණි. ලෝකයේ ඇති සියලුම ඔරලෝසු නතර වී ඇතිවාක් මෙන් ඇයට හැගුණි. අඩුම තරමේ ඇගේ හදවත ගැහෙනවාද කියාවත් ඇයට නොවැටහේ...

ඇය කිසිදාක මෙවැනි හමුවීමක් බලාපොරොත්තු වුයේ නැත. දින, සති, මාස ගණන් ගත වුණද ඇය කවදාවත් මෙවැනි දෙයක් බලාපොරොත්තු නොවිණි. අවුරුදු හතරක්... අවුරුදු හතරක් කියන්නේ එසේ මෙසේ කාලයක් නෙමේ. මේ කාලය

පුරාවටම ඇය හැඬූ වාර ගණන දන්නේ ඇය පමණකි. ඒ කොහොම වුණත් මෙය නම් සිදුවිය නොහැක්කකි. සිහිනෙකින් වත් නොසිතූ දෙයකි... ස්වභාදහම විසින් කරන ලද මහා ප්‍රාතිහාර්යකි...

ශවුර්යාගේ ඇස්වලින් කඳුළු කැට කඩා හැලුණෙ ඇයටත් නොදැනීමය. ඇගේ දෑත් දැන් තවත් සීතල වී ගොසින්ය. ඇගේ දෑස් උණුසුම් ය. නමුත් ඒවා අප්‍රකාශිතය. සිතුවිලි සමග පවා පොරබදින මෙවැනි කාලෙක මෙවැනි හමුවීමක් කොහොමත් බාලාපොරොත්තු විය නොහැකිය.

කඳුළු බිඳු රතු පැහැති කම්මුල් හරහා සෙමෙන් සෙමෙන් පහලට ගලා ආවේය. ඇගේ දෑස් දිලිසුණි. ශවුර්යා ඇගේ දෑස් එකඑල්ලේම ඉදිරියට යොමුකරගෙන සිටියාය... ඇය එක් මොහොතකට හෝ දෑස් ඉවතට නොගත්තාය. එය තත්පර කිහිපයක් වුවද ඇයට එය කල්පයක් බඳු විය.

ඔව් මේ ඔහුය...

වසර හතරකට පෙර ඇයට මගහැරුණු ඒ අහංකාර යෞවනයා... ඒ කලුපාට ඇස් හිමි මායාකාර සිත්තරුවා... ඔව් මේ ඔහුම තමා...

***ඒ ඇස්...!***

** * **

# 02.

ශවුර්යා තම උපරිම වේගයෙන් රෝහල වෙත දිව ගියා. ඉදිරියට හමුවෙන මිනිසුන්ගේ ද ඇඟෙහි හැපෙමින් ඇය ඉදිරියටම දිව ගියේ දෑස්වල කඳුළු පිසදා ගන්නා ගමන්. ඒ හවස් වරුවකි. නුවර සුවසෙවණ රෝහල මිනිසුන්ගෙන් පිරී ගොස් තිබුණි. වෛද්‍යවරුන් රෝගීන් පරීක්ෂා කිරීම සඳහා විවිධ අංශ වෙත ගමන් කරමින් සිටිති.

පුලුවන් ඉක්මනට රෝහලේ ප්‍රධාන දොරටුවෙන් ඇතුලු වුණු ශවුර්යා ප්‍රධාන කවුන්ටරය වෙත ඇදුනේ ඔහු ගැන දැනගන්න.

“ අනේ පුලුවන් ඉක්මනට කියනවද දැන් පැය හතරකට විතර කලින් මෙහෙට accident වෙලා ආව patient ඉන්නේ කීවෙනි ward එකේද කියලා...”

“ මොකද්ද patient ගේ නම? ”

“ M.M..යුවාන් ස්වස්තික මාගොඩාආරච්චි ”

“ 3rd floor ward number 7 ”

“ අනේ thank you so much ”

ඒත් එක්කම ශවුර්යා තුන්වෙනි තට්ටුවේ ward 7 හොයගෙන ගියේ ඉක්මනටම ඔහුව බලන්න ඇයට ඕන වුණ නිසා.

ඇය සෙනග පිරුණු කොරිඩෝව දිගේ ඉදිරියටම දිව ගියා. ඇයට කොරිඩෝවේ අන්තයක් නොපෙනුණි. ඇය තවත් සිතන්නේ ඔහු ගැන පමණකි. ඇය ඔහුගේ නමම කොඳුරමින් සිටී. ශවුර්යා ICU එක හොයන් ඉස්සරහට ගියා. ඇය තම පාද පොළොවේ ගැවෙන නොගැවෙන තරමින් බිම තබමින් වේගයෙන් ඉදිරියට ගියා. ඇයට පෙනුනේ ඉදිරියට හම්බෙන මිනිසුන්ගේ ඡායාව පමණකි. දෙපස වූ බිත්තිද අපැහැදිලිය. ඇයට පෙනී ගියේ ඇගෙ ඇස් ඉදිරියේ මීදුම් වලාවක් අරක් ගෙන ඇති හැටිය.

ඔව් මේ එයයි. කොරිඩෝව අවසානයේ ඇයට දකුණු පසින් වූයේ  ICU එකයි. ශවුර්යා එතනම ගල් ගැහුණා. ඇය සෙමෙන් අඩියක් ඉස්සරහට තිබ්බේ දොර අරින්න කියලා හිතාගෙන. කාමරය ඇතුලින් ආවේ නහය ගලවගෙන යන තරම් තද සේලයින් සැරකි. කාමරයේ වූ වාතය බීප්...බීප්... හඬකින් පිරී තිබුණි. ශවුර්යාගේ හදවත තවමත් නොසන්සුන් ය. ඇය කාමරය වටා දෑස් යැවුවා. ඇගේ දණහිස් වෙවුලන්නට විය. ඇයට තව අඩියක් හෝ ඉදිරියට තැබිය නොහැක. ශවුර්යාට ඉස්සරහා තිබුණ ඇඳ වටේටම වෛද්‍යවරුන් පස්දෙනෙක් විතර වටවෙලා හිටියා. ඔවුන්ගේ මුහුණුවල තිබුනේ ඒ තරම් සතුටුදායක තත්වයක් නෙමේ. ඔවුන් යමක් ගැන කතා කරමින් හිටියත් ඒ මොකද්ද කියලා ශවුර්යාට ඇහුණේ නෑ.

ජනෙල් කවුළු අතරින් ආව හුළං රැල්ල ඇයව තවත් සීතල කලා. දොර ළඟ හිටගෙන ඉන්න ශවුර්යාව දැක්ක එක ඩොක්ටර් කෙනෙක් ඇඳ ළඟින් ටිකකට ඈත් වුනේ ශවුර්යාට ඇඳ ළඟට එන්න ඉඩ දීලා. එක්වරම ඇයට ඇගේ හදවත නතර වුණා වගේ දැනුණා. ශවුර්යාගේ ඇස්වලින් කඳුළු එළියට පැන්නා. ඇය ඉදිරියේ වූ දර්ශනය නම් ඒ තරම් සතුටුදායක වුණේ නෑ.

ඒ ඔහුයි... නෑ...නෑ... මේ පැය හතරකට කලින් ශවුර්යාත් එක්ක හිටපු යුවාන් නෙමේ. මේ කොහෙත්ම යුවාන් නෙමේ... ශවුර්යාගේ කඳුළු ඉකිබිඳීමක් විදියට වර්ධනය උනා. ඇයට මෙය කොහෙත්ම දරාගන්න පුලුවන් වුණේ නෑ.

ඔහුගේ මුහුණ මළානික වෙලා තිබුණා... ඔහුගේ වම් අත හා පාදය ද වෙලුම් පටි වලින් ඔතා තිබුණා... ඔහුගේ කොන්ඩයද අවුල් වී ගොස් තිබුණා... යුවාන්ගේ තොල්ද සුදුමැලි වෙලා තිබුණා... යුවාන්ගේ දකුණු ඇහැ ළඟ ලේ කැටි ගැසී ඉදිමිලා තිබුණා...

නෑ... එහෙම වෙන්න බෑ... ශවුර්යාගේ හිත කිව්වෙම එහෙම. ඊයේ හවස ශවුර්යා එක්ක මල්වත්තේ ඇවිදින්න ගියපු යුවන් නෙමේ මේ...

ශවුර්යා යුවාන්ගේ අත අල්ලා ගත්තේ ඇගේ කඳුළු කිසිම සීමාවක් නැතුව කම්මුල හරහා පහලට ගලා එද්දී... ඔහුගේ අත් තාමත් සීතලය. ඒත් එක්කම ඇගේ මතකට මාස හයක් පමණ ආපස්සට ගියේ හරියට මුහුදු රැල්ලක් වගේ.

ඔවුන් දෙන්නාම හිටියේ රූෆ්ටොප් එකේ.වෙලාව හවස හයට විතර වෙන්නැති. ඔවුන් දෙන්නා ඈත කඳු වළල්ලක් අතරින් ඉර බැහැන් යන විදිය බලාගෙන හිටියා. මද සුළං රැලි ඔවුන්ව හෙමින් සීරුවේ සිපගන්නා අතර රක්ත වර්ණ සූර්යාලෝකයෙන් ඔවුන් නැහැවී ගියේය. ශවුර්යා යුවාන්ගෙ උරහිසෙහි ඔලුව තියන් ඉන්න අතරේ යුවාන් චිත්‍රයක් අඳින ගමන් හිටියා. ඇගේ කෙස් සුලං රැල්ලත් එක්ක පොරබදින විදිහ... ශවුර්යා හිනා වෙද්දී ඇගේ කම්මුල් වලගැහෙන විදිය දැක්කම යුවාන්ට හිතුණේ මේ ලෝකේ ඉන්න වටිනම කෙනා ශවුර්යා කියලා.

“ මට කවදාමහරි මොනාහරි දෙයක් උනොත්... ” ඒත් ශවුර්යා යුවාන්ට වාක්‍ය සම්පූර්ණ කරන්න දුන්නේ නෑ.

“ ඔයාට පිස්සුද යුවාන්??? ඔයාට මොකුත් වෙන්නේ නෑ ” එහෙම කිව්ව ශවුර්යා ඔහුව තදින් වැලදගත්තා.

“ මාත් එහෙම හිතනවා ” ඔහුගේ හඬ උණුසුම් විය.

* * *

“ අනේ... යුවාන්... අනේ ඇස් අරින්නකෝ... ඔයාට මේ මොකද උනේ කියන්නකෝ... ” ශවුර්යා යුවාන්ගේ අත අල්ලගෙන හයියෙන් ඇඬුවා.

යුවාන් සෙලවුණේ වත් නෑ... ඔහුගේ දෑස් ද පියවී ගොසින් ය... ඔහු තවමත් සිහිසුන් ය...

“ ඔයා... ඔයා මට පොරොන්දු වුණා නේද මාව දාලා යන්නේ නෑ කියලා”

“ අනේ යුවාන්... ඇස් අරින්නකෝ... ” ශවුර්යා තව තවත් හයියෙන් ඉකිබින්දා.

ශවුර්යා ඇගේ අත සෙමෙන් සීරුවේ ඔහුගේ නලල වෙත අරන් ගිය අතර සියුම් ලෙස ඔහුගේ හිසකෙස් පිරිමැද්දේ තම කඳුළු පිසදා ගන්න ගමන් ය.

“ අනේ... යුවාන් ඇස් අරින්නකෝ... ”

ශවුර්යා ආයෙමත් සැරයක් මතක ඇතුළේ ගිලුණේ ඇයටත් නොදැනීමය.

ඔවුන් දෙදෙනාම හිටියේ නුවර වැව රවුම දිගේ ඇවිදින ගමන්. දැන් රෑ අටත් පහුවෙලා. වැව් රළ කපාගෙන එන සුළං

පහර ඔවුන්ව සීතලෙන් වෙලාගත්තා. වැව රවුම, වටේට තියෙන වීදි ලාම්පුවල මද ආලෝකයෙන් ආලෝකමත් වෙලා තිබුණා. ගස්වල කොල සුළඟට වැනෙමින් සිලි සිලි හඬක් නැගුවේ වතයේ ඇති නිශ්ශබ්දතාවය බිඳ දමමින්. මල්වතු විහාරයේ පත්තිරිප්පුවට හරි කෙලින් පිහිටලා තියෙන දළදා මාලිගාවේ පත්තිරිප්පුවේ වැඩ සිටින දලදා සමිඳුන්ගේ පිහිටෙන් මුළු නගරයම ශ්‍රද්ධාවෙන් පිරී ඉතිරී ගියා. කිරි සුදු පාට සඳ රැස් වැටී දිදුලන වැව් ජලය දිය රැලි සමඟ සෙල්ලම් කලේ හරියට මාලුන්ටද උකුළු මුකුළු පාන්නාක් මෙනි.

“ ඇයි ඔයා මෙච්චර වේගෙන් යන්නේ... ” ශවුර්යා හඬ අවදි කලේ දෙදෙනා අතර තිබුණ නිහඬතාව බිඳිමින්.

“ මම නෙවෙයි වේගෙන් යන්නේ... ඔයයි හෙමීට එන්නේ ඒකයි... ” යුවාන් අඩි දෙක තුනක් ඉදිරියෙන් යන ගමන් ඇයව නිවැරදි කලා.

ශවුර්යාගේ කම්මුල් රතු වෙනවාක් මෙන් ඇයට දැනුණා. “ ඒත්... වේගෙන් යන එකයි අපි දෙන්නම එකට ඇවිදන් යන එකයි වෙනස්නේ... ” ඒත් එක්කම වගේ යුවාන් ශවුර්යාගේ ඉදිරියට පැමිණ ඇගේ මඟ හරස් කලා.

“ කවදාහරි මන් මෙහෙන් ගියොත්... ම්ම්...මන් නැති අඩුව ඔයාට දැනෙයිද??? ” යුවාන් එහෙම ඇහුවත් ඔහුගේ හඬ බිදෙනසුලු විය.

“ ඇයි ඔයා අද මේ වගේ දේවල් අහන්නේ... ” ශවුර්යා ඔහුගේ අත තවත් තදින් අල්ලා ගත්තා.

* * *

ඇය රෝහල් කාමරය තුළ ප්‍රශ්න සමුදායක ගිලුනා.

" අනේ මට ඔයාව ගොඩක් මතක් වෙනවා යුවාන්...මට ඔයා නැති අඩුව ගොඩක් දැනනෙවා... යුවාන්... " ඇගේ කම්මුල දිගේ ගලන් ආව කඳුළු බිංදුවක් යුවාන්ගේ අතට වැටුනා.

" යුවාන්...නැගිටින්නකෝ... " ඇය හැඬුවාය. " මේ අහන්නකෝ... මට එදා ඔයාට හරි උත්තරයක් දෙන්නත් බැරි උනා...අනේ... යුවාන්... මට ඔයා නැතුව ඉන්න බෑ...මට බයයී...මට ඔයා නැතුව ඉන්න බෑ යුවාන්..."

ඇය තව තවත් හැඬුවා.ඒත් ඇය එක මොහොතකටවත් ඇගේ අත යුවන්ගෙන් ඉවතට ගත්තේ නෑ. ඇගේ මුළු හදවටම බියෙන් හා බලාපොරොත්තුවෙන් වෙලාගත්තා.

ශවුර්යාට ඔවුන් දෙදෙනා එකට ගතකල කාලය...කැම්පස් එකේ රූෆ්ටොප් එකට වෙලා හිටපු හවස්වරු...වැව රවුමේ බංකුවල වාඩිවෙලා කියපු බොළඳ කතා...යුවාන් එක්ක ඉස්සෙල්ලාම ෆිල්ම් එකක් බලන්න ගියපු දවස...ඒ කලු ඇස් දිහා බලන් හිටපු හැම තත්පරයක්ම ශවුර්යාට අයෙ අයේත් මතක් වුණා...ඒ හම මතකයක්ම ඇයට ගෙනදුන්නේ දුක්මුසු හැඟීමක් පමණි.ඒත් දැන්...ඒ හමදෙයක්ම මතකයක් විතරක් වෙලා...පේරාදෙණිය කැම්පස් එකේ රොබරෝසියා වසන්තෙට දෙන්නම එකතු වෙලා හුලඟට ගහන් යන මල් අල්ලපු විදිහ...මල් වත්තට වෙලා අහස දිහා බලන් හිටපු පැය ගණන්...ඔවුන්ගේ ප්‍රථම හාදුව.. ඒත් මේ හැමදෙයක්ම දැන් මතකයක් විතරක් වෙලා...

"යුවාන්...ඔයාට මාව ඇහෙනවද...කතා කරන්නකෝ...අනේ ප්ලීස්...ඇස් අරින්නකෝ...ඔයාට බෑ මාව මේ විදියට තනි කරන්න..."ඇය තම අත තවත් තද කලේ ඇගේ

එක් ස්පර්ශයකින්ව ඔහු යථාතත්වයට පත් වෙයි කියලා හිතාගෙන.

“ මම්ම්... එයාට දැනට ලොකු ප්‍රශ්නයක් නෑ.තාමත් එයාට සිහිය නැතිවෙලා තියෙන්නේ.තව ටික වෙලාවකින් එයාට සිහිය එයි...ඒත්...” එක් වෛද්‍යවරයෙක් දුර්වල හඬකින් එහෙම කිව්වා.

ඇය පිටිපස්ස බලන්නේ නැතුවම ඔලුව වැනුවා.දැන් ඇගේ මුළු ලෝකයම ඇත්තේ මේ පිරිමි ළමයා ළඟ පමණකි.සිහිසුන් වුවද ඔහු ළඟ ඇගේ මුළු ලෝකයම රැඳී පවතී.

ඇය මදක් ඉදිරියට නැමුණා. දැන් ඔවුන් අතර ඇත්තේ අඟල් දෙකක හෝ තුනක ඉඩක් පමණි. ඇගේ හෘද ස්පන්ධනය තව තවත් වේගවත් විය. ඇය ඔහුගේ මුහුණ සියුම් ලෙස අතගෑවා.

“ ඔයාට පුලුවන්ද මාව දාලා යන්න...අපි දෙන්නා එකට හිටපු කාලය...අපේ හීන...ඒවට දන් මොකද වෙන්නේ...” ඇගේ උණුසුම් කඳුළු ඔහුගේ කම්මුලට වැටී කම්මුල දිගේ ගලන් ගියා. ඇගේ කඳුළු නිහඬ වුවද ඇගේ හදවත කුණාටුවක් මෙන් විය.ආදරය,බිය,මතකයන්...මේ හැමදෙයක්ම කුණාටුවකට හසුව ගලා යන්නාක් මෙන් ඇයට දැනුණි.නමුත් ඇය තවත් විශ්වාස කලේ ඔහු මේ සියල්ල අහන් ඉන්නවා ඇති කියලා...

එක්වරම එක ඩොක්ටර් කෙනෙක් තම කටහඬ අවදි කලා. “ අපිට ඔයාට කියන්න දෙයක් තියෙනවා ” ඔහුගේ මුහුණේ වූයේ එතරම් සතුටක් නොවේ...

ශවුර්යා පිටුපසට හැරුණා. වෛද්‍යවරුන් එකිනෙකා දෙස බලාගත් අතර එක් අයෙක් මුව විවර කලා.

*“He lost his memory ”*

# 03.

ඇයට මේ කිසිවක් පිළිබඳ සිතාගත නොහැකිය.දැන්... ශවුර්යාගේ හදවත කැලි කැලිවලට බිඳී ගොසින් ය.මෙය නම් කොහෙත්ම සත්‍යක් විය නොහැකිය.ඇයට මේ ගෙවුණු දවස් කිහිපය දැනුණේ නපුරු හීනයක් මෙනි.නමුත් මෙය යථාර්තය නොවේද...කිසිදා කිසිවෙකුට නොවෙනස් කලහැකි සත්‍යය මෙයම නොවේද...

අනතුර සිදුවී දැන් දවස් තුනකටත් වැඩිය.ඔහුගේ මතකය දැන් සම්පූර්ණයෙන්ම අහිමි වී ගොසින් ය. අඩුම තරම් තමන් කවුද කියාවත් ඔහුට මතක නැත.සිහිය ආවට පස්සේ යුවාන් පැවසූ දෙය ආයේ ආයෙත් ශවුර්යාගේ සිතට වද දුන්නා.මේ දින කිහිපය පුරාවටම ඇයට හරිහැට නින්ද ගියේවත් නෑ.දවස් ගානක් තිස්සේම නිදිමරපු නිසාම ඇගේ සම එල්ලී වැටී ගොසින් ය ඇස් යටද කලු වී ගොසින් ය.රෑයක් දවාලක් ගැන නොසිතා ඇය සිතන්නේම ඔහු ගැනම පමණකි. ඇගේ මුළු ලොවම ඔහුය...

ඒත් දැන්... ඔහුට හැමදේම අමතක වී ගොස් හමාරය.ඇය තවම බලාපොරොත්තු වෙන්නේ දවස් තුනකට කලින් ඇය සමඟ හිටපු පිරිමි ළමයාවයි.ඇයට මෙය කිසිසේත්ම දරාගත නොහැකිය.සිහිය ආ පසු ඔහු පැවසූ වදන් ඇයට අයේ අයෙත් සිහි විය. එය ශවුර්යාට ගෙන දුන්නේ වේදනාවක්ම පමණි.

..............................................................................................

දවසක්ම නික්ම ගිහින් තිබුණත් යුවාන්ට සිහිය ආවෙ නෑ... ඒවෙනකොටත් ශවුර්යා හිටියේ යුවාන්ගේ අත තදින් අල්ලාගෙන.එක්වරම යුවාන්ගේ ඇඟිලි සෙමින් සෙලවුණි. ශවුර්යාට දැනුණු සතුට කියාගන්නවත් බැරි තරම්.ඇගේ මුළු ලෝකයම එළිය වූවාක් මෙන් ඇයට දැනුණි. ඒත් ඇගේ සතුට සීමා වූයේ තත්පර කිහිපයකට පමණි.

එකපාරටම යුවාන් ඇගේ අත ගසාදැම්මා.“ඔයා කවුද??? ඇයි ඔයා මන් ළඟ ඉන්නේ...”මේ වචන ශවුර්යාගේ හදවත පසාරු කරගෙන යන්නට විය.ශවුර්යාගේ හදවත කෑලි කෑලිවලට බිඳී ගියා.ඇය ඒත් එක්කම ඉකිබිඳිමින්ම කාමරයෙන් එළියට දිව ගියා.

යුවාන්ට හැමදෙයක්ම අමතක වෙලා තිබුණට ශවුර්යා හැමදාම එයාව බලන්න හොස්පිට්ල් එකට ගියා. යුවාන්ට කිසිම දෙයක් මතක නැති වුනත් ශවුර්යා හැමදාම එයා දිහා බලලා සතුටු වුනේ යුවාන් දැන් කලින් හිටියට වඩා ටිකක් හරි හොඳට ඉන්න නිසා.

..............................................................................................

දැනට හැමදෙයක්ම වෙලා දවස් හතරක්ම ගෙවිලා ගිහින්. ශවුර්යා උදෙන්ම නැගිට්ටේ යුවාන්ව බලන්න හොස්පිට්ල් එකට යන්න හිතාගෙන.එක්මනට ලෑස්ති වුණ ඇය කාර් එක ස්ටාර්ට් කලේ පුලුවන් ඉක්මනට යන්න ඕනි නිසා.විනාඩි විස්සක් වගේ යද්දී ශවුර්යා හොස්පිට්ල් එකට ගියා.කාර් එක පාර්ක් එකේ නැවැත්තුව ඇ උදේ කෑම එක අතට අරන් හෙමින් වෝර්ඩ් එකට යද්දිම ශවුර්යා දැක්කා කාමරයේ දොර ඇරලා දාලා තියෙනවා. ඇගේ හිත තරමක් කලබලකාරී විය. ශවුර්යා කාමරයට ඇතුළු වුණා.කාමරය වටේටම දෑස් යැවූ ශවුර්යා එතනම ගල් වුණා.යුවාන් කාමරයේ හිටියේ නෑ.ඇඳ

රෙද්ද තරමක් අවුල් වී තිබුණි.කාමරයෙන් ආවේ සේලයින් සැර පමණි.බෙහෙත් පෙතිද කාමරය පුරා තැන් තැන්වල විසිකර දමා තිබිණි.

ඒත් එක්කම වගේ ඩොක්ටර් කෙනෙක් නර්ස් කෙනෙක් එක්ක කාමරයට ආවා.

“එයා ගියා...” එහෙම කියපු නර්ස් මේසයක් උඩ තිබුණ reports වගයක් අරගෙන කාමරයෙන් එළියට ගියා.

ශවුර්යාගේ ඇස්වලින් කඳුළු බිංදු කඩා වැටුණා.එකදු සමුදීමකින්ද තොරවම ඔහු දැන් නික්ම ගොස් ය...

“කො...කොහේද...එ...එයා....ගියේ?”ඇය ඉකිබින්දා.ඇගේ කටහඬ වෙවුලන්නට විය... ඇය මෙතරම් ආදරය කල ඒ පිරිමි ආත්මය දැන් ඇය ඉදිරියේ නොසිටියේය.

“දැන් පැයකට විතර කලින් එයා discharge වෙලා යන්න ගියා...එයා යන තැනක් නම් කියලා ගියේ නෑ...අපි හිතුවේ ඔයා දන්නවා ඇති කියලා...”

ශවුර්යාගේ මුහුණ සැඩ සුළඟකට හසු වූවාක් මෙන් විය...යන්න ගිහින්...කියන්නෙම නැතුව...එයාට මන් එනකන් තව ටික වෙලාවක් ඉන්න තිබුණා...ඇගේ ඉකිබිඳීම තව තවත් වර්ධනය වුණා.ඇය එතැනම දණින් වැටුණි...“මට බැරි වුණා එයාව බලාගන්න...මන් නිසා තමයි මේ හැමදෙයක්ම වුණේ...” ඇය තවත් හයියෙන් ඇඬුවා.ඇගේ කඳුළු කම්මුල දිගේ ගලාන් ඇවිත් ඇගේ දණහිස් මතට වැටුණා.

“නෑ නෑ ඔයා එහෙම හිතන්න එපා...ඔයාට පුලුවන් ඉක්මනට එයා ගැන හොයලා බලන්න...” හෙදිය එසේ කියමින් ඇයව අස්වසා කාමරයෙන් එළියට ගියා.

ශවුර්යා පුලුවන් ඉක්මනටම පහළට ගිහින් කාර් එකට නැග්ගේ යුවාන්ව හොයන්න යන්න හිතාගෙන.ඇගේ හිත තවමත් නොසන්සුන් විය.ඇයට හැමදෙයක්ම අමතක වී තිබුණද මෙසේ කිසිවක් නොදන්වාම ඔහු යන්න යාවි කියා ඇය කවදාවත් බලපොරොත්තු නොවිණි.

ඇය ඉක්මනට කාර් එක කටුගස්තොට පාරට හැරවූයේ යුවාන්ගේ ගෙදරට යන්න කියලා හිතාගෙන.ඇගේ සිත තවමත් පෙරලි කරන්නෙම ඔහු ගැනමය. ඇගේ සිතතුල දෝංකාර දෙන්නේද ඔහු ගැනමය. ඇය සිත සන්සුන් කරගැනීමට කෙතරම් උත්සාහ කලද ඇගේ හිත වූයේ ඔහු තුළම පමණකි.

කටුගස්තොට පාරේ කොච්චර වාහන තිබුණද කියනවා නම් ඇයට එකම තැන විනාඩි කීපයක්ම වාහනය තියන් ඉන්න සිදුවුණා. මුළු පරිසරයම දුම්වලින් හා වාහන හඬින් පිරී තිබුණි. කටුගස්තොට පාලම උඩ ඇයට විනාඩි පහළොවක් විතර ඉන්නට සිදුවිය. ඇගේ කාරයට එහා පැත්තෙන් නවතා තිබුණු **Benz** රථය දැක්කම ශවුර්යාට මතක් වුණේ යුවාන්ගේ **Benz** එක. ශවුර්යා ඒ වාහනය දිහා බැලුවේ ඒ ඉන්නේ යුවාන්ද කියලා දැනගන්න. ඒත් ඒ ඔහු නොවේ... Driving seat එකට එහා පැත්තේ හිටපු පුංචි ගැනු ළමයෙක් ශවුර්යා දිහා බලාගෙන හිටියා. ඒ පුංචි ළමයාව දැක්කම ශවුර්යාට මතක් වුණේ ඇය පුංචි කාලෙදි තාත්තා අලුතින්ම ගෙනාපු Range Rover එකේ මුලින්ම මාළිගාවට ගියපු දවස...

මහවැලි ගඟේ වතුර නිශ්චල විය. ඈතින් වැහි වලාකුලු කිහිපයක් පෙනුණ අතර වැහිලිහිණියෝ කිහිප දෙනෙක් පියඹා ගියේය. ඒත් එක්කම වගේ මද පින්නක් හමා ගියා. වාහනයේ එක්වරම දිනේෂ් ගමගේගෙ සෙංකඩගල නුවර සිංදුව ප්ලේ විය.

*“ සෙංකඩගල නුවරට වහින වැස්ස හවස....*
*නුඹ ගැන මතක අහුරු දුන්නා පෙර ලෙසම....*
*සුන්දර වැව රවුමට යන්නේ නෑනේ තවම....*
*ඇවිලෙන මතකය මට ගන්න බෑනේ හිතට....*

*ඔබගේ... තුරුලේ... ගිලිහී... පරවූ...*
*මලකී... සුළඟේ... පාවූ...*
*අහසත්... කලු වී... අකුණුත් බොඳ වී...*
*කඳුලේ... පැටලී... තනිවී... ”*

වාහනෙන් එළියට අත දැමූ ශවුර්යාගේ අතට පිනි බිංදු වැටුණි. පිනි බිංදුව දෙස මොහොතක් බලාසිටි ශවුර්යාගේ මතකය මිනිත්තු කිහිපයකට අතීතයට කිඳා බැස්සා. ඇගේ අත දිගේ ගලන් ආ පිනි බිංදුව ඇගේ ගවුම මතට වැටුණා. ඇගේ මතකය කුණාටුවක් මෙන් අපැහැදිලි විය. ඇගේ මතකය දින හතරක් ආපස්සට ගියා.

ඒ උදේ එකොළහට විතර ඇති. ශවුර්යා යුවාන් එක්ක පේරාදෙණිය පාරේ ඇවිදන් යන ගමන් හිටියේ. ඔවුන්ගේ දෑත් තදින් වෙලී තිබුණේ කවදාවත් නොබිඳිය හැකි ලෙසය. ඔවුන්ගේ දෑත් උණුසුම් ය. ඔවුන්ගේ දෑස්ද එකිනෙකට ගැටී තිබුණේ අඳුරු නමුත් ප්‍රේමණීය මායාවකය හසුවූවාක් මෙනි.

“ අපි Ice Cream එකක් කමුද? ” යුවාන් එහෙම ඇහුවේ ඔවුන් තුල පැවති නිහඬතාව බිඳින ගමන් ය.

“ ම්ම්ම්... හරි... අව්වත් සැර නිසා මේ වෙලාවට හොඳයි නේද...” ශවුර්යා එයට ඉක්මනින්ම උත්තර දුන්නේ මේ එයට හොඳම වෙලාව නිසා.ශවුර්යා හැමවෙලේම යුවාන් ගැන හිතුවා...මේ තරම් ආදරණීය...මේ තරම් කඩවසම් පිරිමි

ළමයෙක්...ඔහු නිතරම ශවුර්යාව තේරුම් ගත්තා...ඇගේ ඕනෑඑපාකම් වෙන කාටත් වඩා ඔහු දැනන් හිටියා...

“ හරි එහෙනම්... ඔයා කැමතිම Oreo Flavour එකනේ... මන් ඒකෙන් දෙකක් අපි දෙන්නටම ගේන්නම්... ”

ශවුර්යා ලැජ්ජාවෙන් රතු වුණා. “ ඔයා මන් ගැන හොදට දන්නවා නේද... ” ඇය හිනාවෙන ගමන්ම ඔහුගේ උරහිසට සෙමෙන් තට්ටුවක් දැම්මා.

“ එහෙම නැතුව කොහොමද ඉතින්... ” ඔහු ඇස් හීනි කරවන , වෙන කාටවත්ම දෙන්නැති හිනාවක් මුවට නගාගෙන පාරෙන් එහා පැත්තේ තියෙන Ice Cream Store එකට ගියේ ශවුර්යාට එතනම ඉන්න කියලා.

ශවුර්යා පාරෙන් එහාපැත්තට වෙලා යුවාන් එනකල් බලාගෙන හිටියා. යුවාන් පාරෙන් එහා පැත්තේ ඉදන් ශවුර්යාට අත වැනුවේ ‘මන් ආපහු එනවා’ කියන ගමන් ඇසක්ද ඉඟිමරමින්.

ශවුර්යා අගේ බෑගය තුළට අත දාගෙන යමක් හොයමින් හිටියා. වාහනවල ශබ්ද නිසා පරිසරයම ඝෝෂාකාරි විය. කැම්පස් එකට එහායින් යන කෝච්චියක හඬද ශවුර්යාට ඇහුණා.

වාහන නොනවත්වාම ඉදිරියටම ඇදුණා. යුවාන් Ice Cream අරන් පාර අයිනේ හිටගෙන ඉන්නවා ශවුර්යා දැක්කේ ඒ වෙලාවේදීයි. නමුත් ඇය හීනෙකින්වත් හිතන්න ඇති මේ නැවත පැමිණීම මේ තරම් වේදනාකාරි වේවි කියලා.

යුවාන් ඒත් එක්කම පාර මාරු වෙන්න සූදානම් වුණා.

හැමදෙයක්ම නතර වුණේ නෑ... එය තව තවත් දිගු වුණා... එක් තත්පරයක් ඇයට කල්පයක් මෙන් විය...

සූර්යාලෝකය ගස් අතරින් පාරට වැටී තිබුණා. යුවාන්ගේ සෙවණැල්ලද ඒ අතරින් පෙනුණා. යතුරු පැදියක් ධාවනය වන හඬ ඇතින් ඇසුණි. ඇගේ පපුව තද විය. කොහේ සිට හෝ පැමිණි අමුතු බියක්ද ඇයට දැනුණි.

ඔහු තවත් අඩියක් ඉස්සරහට තිබ්බා. එක්වරම සියල්ල සුනු විසුනු විය.

එක්වරම වාහනයක හෝන් එකක් හයියෙන් ඇසුණා. ඒත් එක්කම වගේ කවුරුහරි ඇගේ නම කියලා කෑගහනවා ශවුර්යාට ඇසුණා. ඇගේ හුස්ම හිර වෙනවාක් මෙන් ඇයට දැනුණා.

ඒ සියල්ල ඇගේ නෙත ගැටුණේ අහම්බයකින් මෙනි.

එක් වාහනයක් කොහෙදෝ සිට ඕනෑවටත් වඩා වේගෙන් පැමිණියේය. වාහනය තව තවත් යුවාන්ට සමීප විය. ඔහුගේ හිස එක්වරම වාහනය දෙසට හැරුණා. ඔහුගේ දෑස් විශාල විය. ඔහු අඩියක් පිටුපසට තැබීමට උත්සාහ දැරුවත් ඔහුට කාලයට නම් හරස් විය නොහැකි වුණා.

ගතවූයේ තත්පර කිහිපයකි. ක්‍රී...ක්ක්ක්.... එක්වරම විශාල ශබ්දයක් මුළු වාතලය කපාගෙන පැතිරුණා. ඔහුගේ සිරුර වාහනයේ ගැටී ඉස්සරහට විසික් වුණා... ඔහුගේ බෑගයද ඈතට විසික් වුණා... අතේ තිබුණ Ice Cream එකද කොතැනට විසිවූවාදැයි නොදනී... ශවුර්යාට මොහොතකට දැනුණේ මේ නපුරු හීනයක් වෙන්න ඇති කියලා... වාහනය එතනම නතර වෙලා තිබුණා...

“ නෑ..... ” ඇගේ කෑගැසීම එතනම දෝංකාර දෙන්නට විය. ඇගේ අතේ වූ බෑගයද ඇයට අත හැරුණි. ඇගේ හදවත නතර වෙනවා මෙන් ඇයට දැනුණා. ඇයට සෙලවීමට පවා නොහැකි වුණා. ඇයට හුස්ම ගැනීම පවා අපහසු වුණා.

ශවුර්යා දැක්කේ යුවාන් බිම වැතිරිලා ඉන්නවා විතරයි. ඔහුගේ සිරුර සුළඟට අහුවුණ ගසක් වගේ ඇඹරී ගොස් තිබුණි. ඔහුගේ ඇඟින් දරුණු විදියට ලේ වහනය වෙමින් තිබුණා. ඔහුගේ දෑස් අඩක් විවෘතව කලු ඉංගිරියාව හිස තුළට කිදා බැස තිබුණා. ඔහුගේ නළල හරහාද ලේ ගලමින් තිබුණා.

නැගිටින්න... නැගිටින්න...

ඇගේ කකුල් ඇයව ඉදිරියටම ගෙන ගියා. නැත්තන් බලෙන්ම තල්ලු කරන්න ඇති.

ලෝකය අඳුරු ලෙස භ්‍රමණය වෙමින් තිබුණි. ඇය ඉදිරියේ වූ යුවාන්ගේ ඡායාව පවා ඇයට අපැහැදිලි විය. ඇයට දැන් කිසිවක් හරිහැටි පෙනෙන්නේද නැත. ඇගේ දෑස් කඳුලින් බරවෙලාය. ඇගේ හදවත කෙතරම් වේගයෙන් ගැහෙනවාද කියනවා නම් ඇයට හිටගෙන සිටීම පවා අපහසු විය. ඇය එතනම දණින් වැටුණි. දැන් ඇයට කිසිවක් ඇසෙන්නේද නැත. ඇයට මේ කිසිවක් විශ්වාස කල නොහැකිය. විනාඩි ගානකට කලින් ඇයත් සමඟ සිටි යුවාන් දැන් ලේවලින් නැහැවී පාර මැද වැතිරී සිටියේය.

මේක ඇත්තක් නෙමේ... මන් මේ දකකින්නේ හීනයක්... මේක ඇත්තක් වෙන්න බෑ...

ශවුර්යා යුවාන්ට තව ටිකක් ළංවෙන්න හදද්දීම කවුරුහරි ඇගේ අතින් අල්ලන් ඇයව නැවැත්තුවා.

“ එපා... ළඟට යන්න එපා ”

ශවුර්යා අත දමා ගහලා යුවාන් ළඟට දිව්වා. ඇය ඔහු අසල බිම දණ ගසා ගත්තා. ශවුර්යාගේ අත් තදින් වෙවුලුවා. ඇය එතන හයියෙන් හඬා වැටුණා. මිනිසුන් බොහෝ දෙනා දැන් ඔවුන් අසල රැස්වී සිටිති. ඇස් සිය ගාණක් ඔවුන් වෙත

යොමුවෙලා තිබුණා. යුවාන්ගේ මුහුණ සුදුමැලි වී ගොස් තිබුණා. ඔහු සිහිසුන් ය. ඔහුගේ හිසකෙස් හා තොල්වලද ලේ තැවරී තිබුණා.

“ අනේ යුවාන්... නැගිටින්නකෝ... ”

ඔහු කිසිවක් කීවේ නෑ.

ඇගේ මනස එක්වරම මතක ගොන්නක් බවට පත්වුණා. ඔහුගේ විහිළු... ඔහුගේ හිනාව... මේ හැමදෙයක්ම ඇයට මතක් වුණා...

ඇයට සයිරන් නළා හඬක් ඇසුණා. නමුත් ඇයට දැනුණේ එය ඔවුන්ගෙන් ගොඩක් දුරස් වී ඇති බවයි. ඇගේ දෑස් වලින් කඳුළු කඩා වැටෙද්දී ඇය ඉදිරියේ වූ දර්ශනය බොඳ විය. ඇයට සෙනේශා ගේ කටහඬ ඇසුණා.

“ අනේ ශවුර්යා... යුවාන්ට මොකුත් වෙන්නේ නෑ... ඔයා බයවෙන්නේ නැතුව ඉන්නකෝ... ”

ඇය ඉදිරියේ වූ දර්ශනය තව තවත් බොඳ විය. කෑගැසීම්... පියවර හඬවල්... මේ අවුල් ජාලවම ටිකින් ටික ශවුර්යාට නැසී ගියා...

මට මේක බලන්න බෑ...

ශවුර්යාගේ ඇඟිලි යුවාන්ගේ කමිසය මත තදින් වෙලුණා. ශවුර්යාට ඇගේ ඔලුව කැරකෙනවා වගේ දැනුණා. මුළු ලෝකයම ඇල විය. ඇගේ දෑත්ද සීතල විය. ශවුර්යා ඔහු අසලින්ම ඇද වැටෙද්දී ඇයව සම්පූර්ණයෙන්ම කලු කුහරයකට ඇද වැටෙනවා වගේ ඇයට දැනුණා. ඒත් එක්කම වගේ ඇතින් ඇගේ නම දෝංකාර දුන්නා.

* * *

අනතුරින් පසු සිදුවූ කිසිවක් ඇයට මතක තිබුණේ නෑ. සෙනේශා කිව්වේ ඇය එතනම ඇද වැටුණා කියලා. සෙනේශා ඇයව නිවසට රැගෙන ගිය බවත් යුවාන්ව සුවසෙවණ හොස්පිට්ල් එකට රැගෙන ගියා කියලත් කිව්වා. ශවුර්යා ඇහැරුණේ පැය තුනකට විතර පසුවය. ඉක්මනින් ලෑස්ති වුණ ඇය එවෙලාවේම හොස්පිට්ල් එකට ගියා. ඊටපස්සේ වුණ හැමදෙයක්ම ටිකින් ටික ශවුර්යාට මතක් වුණා.

ශවුර්යා පැය භාගයකටත් කිට්ටුව කටුගස්තොට පාරේ ඉඳලා කුරුණෑගල පැත්තට හැරෙව්වේ යුවාන්ගෙ ගෙදරට යන්න කියලා හිතාගෙන. ශවුර්යා යුවාන් ගේ ගෙදර ගේට් එක ළඟ කාර් එක නැවැත්තුවේ ගේ අස්සට යන්න කියලා හිතාගෙන.

ගේට් එක ඇරලා දාලා තිබුණා.

ඇය වෙවුලන ඇඟිලිවලින් ගේට්ටුව තල්ලු කළා. ඇය හිතුවේ යුවාන් ගේට්ටුව ළඟට ඇවිත් ඇයව ගේ ඇතුලට එක්කන් යාවී කියලා. ඒත් එහෙම වුණේ නෑ. යුවාන්ගේ ගෙදරින් කිසිම ශබ්දයක් ඇහුණේ නෑ. මුළු පරිසරයම නිහඬ විය. මිදුලේ හැමතැනම කොළ වැටිලා තිබුණා.

ශවුර්යා ගේ ඇතුළට ගියා. ගෙදර ඉස්සරහා දොර ඇරල දාලා තිබුණා. ශවුර්යා යුවාන්ට දෙතුන් පාරක්ම කතා කරා. ඒත් කවුරුවත් උත්තරයක් දුන්නේ නෑ. මුළු ගෙදරම ලීබඩු වල සුවඳින් පිරිලා තිබුණා. පරණ උළුවහු, ලී දොරවල්... මේ හැමදෙයක්ම කලින් විදියටම තිබුණා. ඒත් ගෙදර අද වෙනදටත් වඩා නිශ්ශබ්ද වුණා. යුවාන්ගේ අම්මත් ගෙදර හිටියේ නෑ. යුවාන්ගේ අම්මා අද පානදුර යුවාන්ගේ පුංචිඅම්මලාගේ ගෙදර

යනවා කියලා යුවාන් දැන් සතියකට විතර කලින් කිව්වා කියලා ශවුර්යාට මතකය. ගේ ඇතුළටම යද්දී ශවුර්යා දැක්කේ යුවාන් convercation එක දවසේ ගත්ත පොටෝ එක.

ගෙදර හැම ජනෙලයක්ම ඇරලා දාලා තිබුණා.

ශවුර්යා යුවාන්ගේ කාමරය තියෙන පැත්තට ගියා. තියන තියන හැම අඩියක් පාසාම ඇයට දැනුණේ තවදුරටත් තමන්ට අවසර නැති තැනකට අනවසරයෙන් ඇතුළු වුණා වගේ. ඔහුගේ කාමරයේ දොරද ඇරලා දාලා තිබ්බා. ඔහුගේ කාමරය තරමක් අපිළිවෙල වී තිබුණා. යුවාන්ගේ කාමරයේ කලින් තිබ්බා වගේම තිබුණා. ශවුර්යා යුවාන්ට මේ ගන්න තිස්දෙවෙනි කෝල් එක. යුවාන් පෝන් එක ඕෆ් කරලා තිබ්බා. ඇය කොච්චර උත්සාහ කලත් එය සාර්ථක වුණේ නෑ.

යුවාන්ගේ මේසය ඒ විදියටම තිබුණා. මේසය උඩ පොතක් දිගහැරලා තිබ්බෙ හරියට ආයේ ඇවිල්ල කියවන්න කියලා තියලා ගිහින් වගේ. යුවාන්ගේ බෑගයද දොර පිටිපස්සේ එල්ල තිබුණා. හිරු එළිය ජනෙල් පියන් අතරින් අවිත් ඇඳට වැටී තිබුණා. ගිය අවුරුද්දේ යුවාන්ගේ උපන්දිනේට ශවුර්යා දුන්න ඔවුන් දෙන්නා එකට ඉන්න පොටෝ එක තාමත් ජනේලය ළඟම තියලා තිබුණා.

ශවුර්යා ඇඳ උඩ ඉඳගෙන මේසය උඩ තිබුණ පොත අතට ගත්තා. ඒත් එක්කම වගේ පොත ඇතුළේ තිබුණ පුංචි කොල කෑල්ලක් බිමට වැටුණා. එක්වරම බිමට වැටුණ කොල කෑල්ල අතට ගත්තේ හරියට කොල කෑල්ල අතුරුදහන් වෙයි කියලා බයකින් වගේ.

කොල කෑල්ල අතට ගත්ත ශවුර්යා ඒක දිගහැරියේ ලියලා තියෙන්නෙ මොකද්ද කියලා බලන්න. ඒ යුවාන්ගේ අත් අකුරු... ඒත් ඒවා ටිකක් අපහැදිලි විය. ශවුර්යාගේ හදවත

වේගයෙන් ගැහෙන්නට විය. කොල කාලේ ලියලා තියෙන්නෙ මොනවද බලන්න ශවුර්යා එය හෙමින් කියෙව්වා.

***" කවුරු හරි ගෑනු ළමයෙක් මන් නිසා ගොඩක් විඳවනවා... අඩුම තරමේ මන් එයා කවුද කියලාවත් දන්නේ නෑ... මට ඕනෙ නෑ තවත් එයාව රිද්දන්න... එයාට ඉක්මනටම මාව අමතක වෙලා යාවී..."***

" ඔයාට දැනටමත් මාව අමතක වෙලා " ශවුර්යාගේ හදවත සැලුණි. " ඒත් මට ඔයාව කවදාවත් අමතක වෙන්නේ නෑ... අමතක කරන්නත් බෑ..." ශවුර්යා තනිවම සිතුවා.

ශවුර්යා ආයෙත් පාරක් යුවාන්ට කෝල් කරා. ඒත් answer කරේ නෑ. ශවුර්යා හිතුවේ යුවාන් අම්මා ළඟට යන්න ඇති කියලා. ඒ වෙලාවෙම ශවුර්යා යුවාන්ගේ අම්මට කෝල් කරා. ඒ පාර නම් යුවාන්ගේ අම්මා කෝල් එක answer කරා.

" හෙලෝ පුතේ... කියන්න... " යුවාන්ගේ අම්මා කතා කලා.

" අනේ අම්මේ... යුවාන් පානදුර ආවද? "

" නෑනේ පුතේ... ඇයි මොකද වුණේ කියන්නකෝ... "

" යුවාන් මෙහෙන් ගිහිල්ලා... අඩුම තරමේ ඩොක්ටර්ස්ලවත් දන්නේ නෑ එයා කොහෙද ගියේ කියලා "

" පුතේ ඔයා ගෙදර බැලුවද? "

" ඔව් අම්මේ... මන් දැන් ගෙදර ඉන්නේ... ගෙදර දොරජනෙල් ඔක්කොම ඇරලා දාලා... ඒත් ගෙදර කවුරුවත් නෑ... එයාගේ පෝන් එකත් වැඩ නෑ... "

“ අනේ පුතේ... ” යුවාන්ගේ අම්මාගේද කටහඬ නොසන්සුන් විය. “ පුතේ තව ටිකක් හොයලා බලන්න... එයා වැඩි දුරක් ගියා වෙන්න බෑ... ”

“ හරි අම්මේ... මන් උපරිම ට්‍රයි කරනවා...බුදු සරණයි”

යුවාන්ගේ අම්මා පෝන් එක කට් කරා.

ශවුර්යා කාමරය දිහා ආයෙත් හැරිලා බැලුවා. “ මන් කොහොමහරි ඔයාව හොයාගන්නවා. ” ශවුර්යා හිතුවා. “ඔයාට මාව අමතක වුණත්... ”

ශවුර්යා එහෙම්මම ගෙදරින් එළියට බැස්සේ ඔහුව සොයාගන්න කියලා හිතාගෙන.

* * *

# 04.

ශවුර්යා දිගින් දිගටම යුවාන්ව හෙව්වා. නුවර ටවුන් එකේ , මාර්කට් එකේ , පුලුවන් හැමතැනම යුවාන්ව හෙව්වා. යුවාන්ගේ යාලුන්ටත් කෝල් කරලා බැලුවට ඒ කවුරුවත් එයාව දැකලා තිබ්බෙ නෑ.

ශවුර්යාට යුවාන්ව මුලින්ම හම්බුන දවස මතක් වුණා. ඇගේ මතකය අවුරුදු පහක් පමන ආපස්සට ඇදුණා.

ශවුර්යා අභිලාෂිණී රත්නකේශර

මේ ශවුර්යාගේ university එකේ first year එක. ශවුර්යා ඉන්නේ Art Faculty එකේ. ඉමක් කොනක් නැති ජීවිතේ ඉබාගාතේ ඇවිදලා ඇවිදලාම හති වැටුනට පස්සේ පළවෙනි අඩිය තිබ්බෙ මෙතන්ට. ගොඩක් අය මෙතනට එන්නේ ආදරය හොයාගෙන. ලොකු රොබරෝසියා ගස් අතර පෙම් කෙලින සුරදූතයන් අතරේ ශවුර්යා මෙතනට ආවේ ඇයවම හොයගෙන... ඇගේම ජීවිතේ හොයාගෙන.

සමහරු හිතනවා ඇති කලාව කියන්නේ හරි ලේසි දෙයක් කියලා. හැබැයි ඒක තමයි මේ ලෝකේ තියෙන තේරුම්ගන්න අමාරුම දේ... කලාව කියන්නේ හදවතින්ම එන්න ඕනි දෙයක්...

ඒ තමයි කැම්පස් එකේ ලෙක්චර් එක්කට යන පළවෙනි දවස. ඇත්තටම ශවුර්යා දන්නේ නෑ art room එක තියෙන්නේ කොතනද කියලාවත්. ශවුර්යා ප්‍රධාන ගොඩනගිල්ලේ කොරිඩෝව දිගේ ඉස්සරහටම ගියේ art room එක හොයගෙන. යනවා යනවා ඉවරයක් නෑ... කොරිඩෝවේ තැන් තැන්වල ළමයි කතා කරකර හිටියා. ළමයි යන පස්සෙම ශවුර්යාත් ගියේ art room එකට යන්න පුලුවන් වෙයි කියලා හිතාගෙන. කොරිඩෝව දිගේ ගියපු හැමෝම තමන්ට අදාල room එකට ගියා. අන්තිමේට ඉතුරු වුණේ ඇය විතරයි.

එතකොටම ශවුර්යා දැක්කා ඉස්සරහා ජනෙල් පඩිය ළඟ හිටගෙන පෝන් එක බල බල ඉන්න ගෑනු ළමයෙක්ව. සමහර විට එයත් මගේ වයසම වෙන්න ඇති. සමහරවිට... එයත් අලුත් කෙනෙක්ද දන්නේ නෑනේ...

" හායි... ඔයා දන්නවද art room එක තියෙන්නේ කොතනද කියලා... " ශවුර්යා එක්වරම ඇහුවා.

" අහ්හ්... හායි... අනේ සොරි ඩාර්ලින්ග්... මන් දන්නෙත් නෑ art room එක තියෙන්නේ කොහෙද කියලා... " ඇය පිළිතුරු දුන්නා.

" ඔයත් අලුත් කෙනෙක්ද? "

" ඔව්... ඔයත් එහෙමද... මන් ගාව කැම්පස් එකේ මැප් එකක් තිබ්බා... මන් මේ ඒක හොය හොය හිටියෙ... ම්ම්... ආ මේ තියෙන්නේ ඒක... "

" ආ හම්බුණාද... එහෙනම් ඉක්මනට යමු නේද... "

" යමු යමු දැනටමත් වෙල ගිහින් තියෙන්නේ... "

අපි දෙන්නම ඉක්මනට art room එකට ගියේ දැනටමත් වෙලා ගිහින් තිබුණ නිසා. දෙන්නාගෙම සිහිය තිබ්බෙ art room එකට යන විදිහ ගැන. කොහොමහරි විනාඩි පහක් විතර විතර ඇවිදලා ඇවිදලාම කොහොමහරි එයාලා art room එක හොයාගත්තා.

" මේ... අපි දැන් අතුලට යන්නේ කොහොමද... professor ගෙන් බැනුම් අහන්න වෙයිද දන්නේ නෑ... "

" හරි... මන් එකයි දෙකයි තුනයි කියද්දිම දෙන්නම දොර අරිමු " එහෙම කියපු ඇය එකායි දෙකායි තුනායි කියලා දොර ඇරියා. දෙන්නගේම හොද වෙලාවට වගේ ඇතුළේ ඇතුලේ හිටියේ ළමයි පහළොවක් විතර... තාම professor ඇවිල්ලත් හිටියේ නැති නිසා දෙන්නම ඇතුළට ගිහින් ජනේලෙට ටිකක් එහායින් වාඩි වුණා.

චිත්‍ර කාමරය තීන්ත සුවඳින් පිරී තිබුණා. තෙලිතුඩෙන් නෙක නෙක රටා මවන සිත්තරුන්ගෙන් කිසිදු හඬක් හෝ නොනැගෙන්නේ අවට නිශ්ශබ්දතාවය බිඳ දැමීමට ඇති බියකින් මෙනි. ඔවුන් පින්සල් හඬක් හෝ නොනැගෙන පරිදි තම තමන්ගේ ආකල්ප චිත්‍රයට නඟන්නේ තම හැඟීම් සමුදාය කැන්වස් රෙද්ද හරහා ලෝකයට ඉදිරිපත් කිරීමට මෙනි. අවට වාතය තරමක් සිසිල් ය. දින ගණනාවක් පුරා නොනවත්වාම ඇදහැලුණු වර්ශාව නිසා අවට ගස්වැල්වලට ලැබී ඇත්තේ නව ජීවයකි. කඳු අතරින් නගෙන සූර්ය කිරණ තිර රෙදි අතරින් වැටී කාමරය ආලෝකවත් කලේය. බිත්තියේ තැන් තැන්වල එල්ලා ඇති සිතුවම් විවිධ මනුෂ්‍ය හැඟීම් කියාපන්නේ අප්‍රකාශිත හැඟීම් සමුදායක් පිටත ලෝකයට මුදා හරින්නාක් මෙනි. ජනෙල් පියන් අතරින් පෙනුණ දර්ශනය ඉතාමත් සිත්ගන්නාසුලු විය. හන්තාන කඳු පන්තියේ සිටගෙන සිටින

දැවැන්ත රුස්ස ගස් යෞවනයන් සුළඟට සෙලවෙන්නේ ඈත සිට අතවනන්නාක් මෙනි.

“ අපි දෙන්නා මෙච්චර දුරක් ආවට මට ඔයාගේ නමවත් අහගන්න බැරි උනානේ... මම සෙනේශා හේසඳී... ” ඇය එකවරම කිව්වා.

“ ඒකනම් ඇත්ත නේද... මම ශවුර්යා අභිලාෂිණී... මම හරියට කැම්පස් එකේ buildings තියෙන තැනවත් දන්නේ නෑ... ඔයාට පුලුවන්ද මට මැප් එක එවන්න... ” ශවුර්යා කිව්වා.

“ ආ ඉන්න මම දන්නම්... ඔයාගේ නම්බර් එක දෙන්නකෝ මට... ”

“ ආ මෙන්න... ”

“ ......................... ”

“ මේ එහා පැත්තේ පුටුවේ කවුරුවත් නෑ වගේ නේද... මන් දැනට ඒකෙ මගේ බෑග් එක දැනට ඒකෙ තියන්නම්... අක්වුරුහරි ආවොත් ආයේ ගන්න පුලුවන්නේ... ” ශවුර්යා එහෙම කියලා එයාගේ බෑග් එක පුටුව උඩින් තිබ්බා.

“ ඔව් නේද... මන් නම් හිතන්නේ නෑ තව ළමයෙක් එයි කියලා... මොකද දැනටමත් වෙලා ගිහින්නේ... ”

“ ඔව්... ම්ම්... ඒත්... අර බලන්න... ” ශවුර්යා එහෙම කියලා දොර පැත්තට අත දික් කරා.

දැනටමත් දොර ළඟ පිරිමි ළමයෙක් හිටගෙන හිටියා... ඇයි ඇතුලට එන්නේ නැත්තේ... ජේන විදියට එයාටත් හොයාගන්න බැරුව ඉන්න ඇති... එයා අඩි හයකටත් වඩා උස ඇති... ටිකක් සුදු පිරිමි ළමයෙක්... ඇත්තටම කියනවා නම්... එයා... හරිම...... මන් මොකටද එයා ගැන හිතන්නේ... මට

එයාගෙන් වැඩක් නැනේ... මටත් පිස්සු... මගේ වැඩක් කරගන්නේ නැතුව ඕප දූප හොයන්නේ...

" කොල්ලා නම් handsome නේ... " සෙනේශා මගේ උරහිසට තට්ටුවක් දාන ගමන් කිව්වා. එතකොටම තමා මන් ආයෙත් මේ ලෝකෙට ආවේ. ශවුර්යා එහෙම්ම ඔලුව වනලා අනික් පැත්ත බලා ගත්තා. එතකොටම ඒ පිරිමි ළමයා ඇවිත් ශවුර්යාට එහා පැත්තේ පුටුවේ ඉඳගත්තා. ඇය ඒ ගැන වැඩිය හිතුවේ නෑ. ඒත් ශවුර්යා දැක්කා සෙනේශා ඇස් කොනෙන් ඒ පිරිමි ළමයා දිහා බලන් ඉන්නවා.

ඒත් එක්කම වගේ professor room එකට ආවා. අපි හැමෝම එත් එක්කම වගේ හිටගත්තා. Professor අවුරුදු පනහක් විතර වයස ඇති.

දැන් මුළු චිත්‍ර කාමරයම සන්සුන් ය. සද්දයක් ඇහෙනවා නම් ඒ ඇහෙන්නේ පින්සල් සියුම්ව එහා මෙහා යන සද්දේ විතරයි. උදෑසන ආලෝකය උස ජනෙල් පියන් අතරින් රිංගා කාමරය පුරාම පැතිර ගියා. නැවුම් තීන්ත, තෙත් කඩදාසි හා පැරණි ලී මේසවල සුවඳ අලුත් දෙයකට, නව ආරම්භයකට මුල පිරුවා. මෙය පළමු දවස වුවද මේ චිත්‍ර කාමරය තුළ ඉපදෙන්නට බලාගෙන ඉන්න ගොඩක් නිහඬ කතන්දර බිත්ති අතර සැඟවී තිබුණා.

ශවුර්යා ජනේලය ළඟ වාඩිවෙලා හිටියා. ඇගේ ඇගේ ඇඟිලි මෘදුව හෙමින් සීරුවේ චලනය වුණේ කැන්වස් රෙද්දට ඇගේ ස්පර්ශය දැනෙන නොදැනෙන ගානටය. ඇය තම පින්සල එහා මෙහා ගෙන ගියේ රිද්මයකට මෙනි. ඇය ඉතාමත් සන්සුන් ය. හරියට ඇය මිනිස් හැඟීම්වලට වඩා වර්ණ තේරුම් ගත්තා වගේ. සෙනේශාද ඇයට එහායින් වෙනම ලෝකයක අතරමංව යමක් සිතුවම් කලේ ඇතැම් විටක කාමරය වටා තම දෑස්ද යොමුකරමිනි.

ශවුර්යාට අනෙක් පස ඒ පිරිමි ළමයාද ඉදගෙන හිටියා. ඔහු අසලින්ද නැගුණේ පින්සල එහා මෙහා යන හඬ පමණි. ඔවුන් එකිනෙකාව දැන සිටියේ නැත. ඇත්තටම කියනවා නම් චිත්‍ර කාමරයේ හිටපු බොහෝ දෙනා එකිනෙකාව දැන සිටියේ නැත.

සිවිලිමේ එල්ලා තිබුණු විදුලි පංකාව කැරකෙමින් අවට වාතයට කිසියම් තියුණු හඬක්ද එකතු කලේය. කාමරයේ බිත්තිවල එල්ලා තිබුණු විදුලි බල්බද කාමරය තවත් ආලෝකමත් කලේය. කාලය නොදැනුවත්වම ගෙවී ගියා.

එවිට එය සිදුවිය...

ශවුර්යාගේ අතේ තිබුණු පින්සල ඇගේ අතින් ලිස්සලා ගියා. එය බිම වැටෙනකොට සියුම් තට්ටුවක් පමණක් නැගූ අතර එය බිම දිගේ පෙරළී යමින් ඇයට එහාපැත්තේ වූ දැව පුටුවේ පස්සහ කකුල ළඟ නතර වුණා. ඇගේ අත තවමත් වාතයේ රැඳී තිබුණා. ඒ වෙලාවේදීම ඔහුගේ දෑසද ඒ වෙත යොමු වුණා. ඔහු හෙමීට පුටුවෙන් ටිකක් ඉදිරියට නැමුනේ එය ඇහිදීමට කියලා හිතාගෙන. ශවුර්යාද ඒ වෙලාවේදීම මදක් පහත් වුණා. ඔහුන්ගේ ඇඟිලි වාතයේ නතර වූයේ එක් ක්ෂණයකිනි. ඔවුන්ගේ දෑස්ද එකට ගැටුණි. තත්පරයක්... දෙකක්... නෑ තුනක්... අඩුම තරමේ තත්පර පහකටවත්... ඒ ඇස් වෙන් වෙන්න නැතුව ඇති...

* * *

# 05.

ශවුර්යා යුවාන්ව පුලුවන් හමතැනම හෙව්වා. අඩුම තරමේ යුවාන් ගියේ කොහේද කියලාවත්, ඉන්නේ කොහේද කියලාවත් ශවුර්යා දැනන් හිටියා. යුවාන්ව ආයේ කවදා දකින්න පුලුවන් වෙයිද කියලා ශවුර්යාට කිසිම අදහසක් තිබ්බේ නෑ.

ජීවිතය එහෙම්ම ගලාගෙන ගියා. අද වෙද්දි යුවාන් අතුරුදහන් වෙලා දවස් තුනක්... යුවාන්ගේ යාලුවොන්ගෙන්, පවුලේ අයගෙන්, මේ හැමෝගෙන්ම ඇහුවත් ඒ කවුරුවත් දැනන් හිටියේ නෑ එයා කොහෙද කියලා.

ඔවුන් දෙන්නා නිතරම වගේ හම්බුණ තැනක් වුණ නුවර ඩී.එස්. සේනානායක මහජන පුස්තකාලය දැන් ශවුර්යාට පෙනුනේ නිකම්ම නිකම් පාලු ගොඩනැගිල්ලක් වගේ. ඒ කොහොම උනත් එය තාමත් මිනිස්සුන්ගෙන් පිරිලා තිබුණා. ඇය පුස්තකායට සෙමෙන් ඇවිද ගියත් ඇගේ පියර බිම ගැටෙමින් යම් හඩක් නැගුවා. ඇගේ දෑස් අවසරයකින් තොරවම ඔහුව සොයමින් සිටියා.

ඔහු එහි නොසිටින බව ශවුර්යා දැනන් හිටියා. ඒත්... ඇය තාමත් එයාව හෙව්වා. ශවුර්යා පුස්තකාලය ඇතුළට ගියා.

නිහඩතාව සැනසීමක් දැනුණ තැන දැන් තියුණු බවත් අපහසුවත් ගෙන දුන්නා. වෙනදට දැනෙනවා වගේ පොත්වල

සුවඳ අද සන්සුන්බවක් ගෙනදුන්නේ නෑ. පොත්වල සුවඳ මුසුවූ වාතයද ගෙන දුන්නේ අමිහිරි බවකි.

ඔවුන් දෙදෙනා එකට හිටපු අවුරුදු ගාණක කාලය පුරාවටම ඔවුන් දෙදෙනාගේම කැමතිම තන වෙලා තිබුණේ මේ පුස්තකාලය. උදේ හවා පොත් කියවන්න, පාඩම් කරන්න... ඒ විතරක් නෙමේ එකිනෙකාගේ හැඟීම් බෙදාගන්න පවා ඔවුන් මෙතනට ආව වාර අනන්තයි... කොච්චර කාර්යබහුල වුණත් එක දවසක් හරි පුස්තකාලයට ඇවිල්ලා, පොත් කියවලා, සහස් උයනේ තියෙන මොකක්හරි event එකකුත් බලලා ආයේ ගෙදර යන්න එයාලා අමතක කලේ නෑ.

ඒත් අද...

අද මේ පුස්තකාලය නිකම්ම නිකම් පුස්තකාලයක් විතරයි. ඒ කොහොමවුණත් ශවුර්යා තාමත් හෙව්වේ ඒ ඇස් විතරමයි. මේ පරණ building එකේ පොත් රාක්ක අටහරේ කොහොමහරි යුවාන්ව හොයාගන්න පුලුවන් උනානම්...

ජීවිතය තත්පරෙන් තත්පරේට ගෙවිලා ගියා. ඇය යන්න ඕන කොතනටද කියලා ශවුර්යා හරියටම දැනන් හිටියා. ඒ අධ්‍යන ශාලාව නෙමේ... නවකතා අංශයටද නොවේ... ජනෙල් ආසන වලටද නොවේ...

ඇය සියල්ල පසුකර කෙලින්ම ඇවිද ගියේ බොහෝ දෙනා නොසලකා හැර තිබූ උස රාක්ක සහ පටු මාර්ගය අතර සැඟවී තිබූ ඈත කෙළවරටය.

ඒ Comic Section එකයි...

එය එතරම් දෙයක් නොවිණි. එතරම් ජනප්‍රියද නොවිණි. මෙහි රාක්ක තරමක් කුඩා ඒවා වුවද ඒවා අනෙක්

රාක්ක මෙන් තද දුඹුරු පැහැයක් ගත්තේ නැත. ඒවා තරමක් අලු පහැයට හුරු කලු පැහැයක් ගත්තේය.

මෙය ඔහුන්ගේ සිනාව පටන් ගත් තැනයි. රහස් කතා නිහඬ වාද විවාද බවට පත් වූ තැනයි. ශවුර්යා සෙමෙන් සෙමෙන් ඉදිරියටම ගියා. ඒ පොත් තාමත් එහෙම්ම තිබුණා. රක්කයේ පැත්තක අලවලා තිබුණ Super heroesලාගේ පින්තූරද එහෙම්ම තිබුණා. කවුරුවත් පිළිවෙලට තැබීමට උත්සහ නොකරමු පොත්ද එහෙම්මම තිබුණා.

යුවාන් හැමදාමත් තෝරාගත්තේ කවුරුවත් වැඩියෙන් කියවපු නැති පොත්. ඒකට හේතුව මොකද්ද කියලා එයාවත් දැනන් හිටියේ නෑ.

ශවුර්යා ඒ එක පොතක් අතට ගත්තා. එය සැහැල්ලු එතරම් බර එකක් නොවීය. ඇය එය සෙමෙන් විවෘත කළා. පොතේ එක් පිටුවක කොනක් ඇතුලට නවලා තිබුණා. ඇය එතනම ගස් ගැසුණා. පොතේ ඉහළ කෙළවරෙන් ඇතුලට නවන එක යුවාන්ගේ පුරුද්දක් වුණා. යුවාන් කවදාවත් book mark එකක් පාවිච්චි කලේ නෑ. එයා හැමවෙලේම පරිස්සමින් එක් කොනක් නැමුවේ හරියට කතාවට කිසිම හානියක් කරන්න ඕන නෑ වගේ.

ඇගේ හුස්ම හිරවූවාක් මෙන් දැනුණි.

මොහොතකට ඇගේ මතකය ඔහු වෙත දිව ගියා. වෙනදානම් යුවාන් පුරුදු විදියටම බිම ඉදගෙන, රාක්කයේ කොනක හේත්තු වෙලා තමන්ගේම ලෝකයක අතරමං වෙනවා. එයට අවසානයක් නොවිණි. ඔහු පොත් අතරේ තමන්ගේම ලෝකෙක සැරිසැරුවා.

*“ Don’t ever judge a book by it’s cover ”* යුවාන් හැමවෙලේම ඒ ගැන කිව්වා. ඒ වචන ඇගේ සිත තුල ආයෙ ආයෙත් දෝංකාර දුන්නා.

ශවුර්යා සෙමෙන් බිමට පාත් වුණා. වෙනදා යුවාන් ඉදගෙන ඉන්න තැන දැන් හිස්ය. ඇය එතනින් ඉදගත්තා.“ ඔයා මේකට ගොඩාක් කැමති වුණා ” ඇය හෙමින් මිමිණුවේ පොත අතේම තියාගෙන. ඇය තම හිස රාක්කයට හේත්තු කරගෙන දෑස් පියාගත්තා.

ඒ තත්පර කිහිපයකට වෙන්න. යුවාන්ගේ හිනාාව ඇයට මතක් වුණා. ඒත් තාමත් එයාව හොයාගන්න බැරිවුණා. කොහෙන් කොතනින් යුවාන්ව හොයාගන්නද කියලා ඇයට තේරුණේ නෑ.

# 06.

අදට ශවුර්යා කැම්පස් එකට ගිහිල්ලා සතියක් වෙලා. ගියපු පළවෙනි දවසෙම වුණ සිද්ධියෙන් පස්සේ ඈය සිටියේ තවමත් කණස්සල්ලෙනි.

ශවුර්යා දැනටමත් විනාඩි දහයක් පරක්කු වෙලා හිටියේ.

ඒත් මේ තමයි පටන්ගැන්ම. ශවුර්යා ඒක තෙරුණේ නැති උනාට ඇගේ ඇස් හැමවෙලේම වගේ ඔහු දිහාවට යොමුවුණා. ඒක ඒ තරම් ලොකු දෙයක් නම් නෙමේ. හැබැයි සාමාන්‍ය දෙයක්. හරියට දෙන්නම දන්නෙම නැතුව එක ළඟ පුටුවල ඉඳගන්නවා. එහම නැත්තන් එය හැමවෙලේම වගේ මතුවෙන පඩිපෙල ළඟදී වේගය අඩුකරලා යනවා වගේ දේවල්.

සමහර විට ඒක miracle එකේ මොකක්හරි trick එකක්ද දන්නේ නෑ.

මේ ඔක්කොම දේවල් පටන් ගත්තේ එක දවසක් lecture එකකට ගියාට පස්සේ. ඒ පුටුව කාටවත් වෙන්කරපු එකක්වත් කවුරුවත් අල්ලගත්ත එකක්වත් නෙවේ.

ශවුර්යා පුටුවේ ඉදගෙන හිටියා. ශවුර්යාට එහපැත්තේම සෙනේශා ඉදගෙන හිටියා. ශවුර්යාට අනිත් පැත්තේ නම් කවුරුවත් ඉදගෙන හිටියේ නෑ. ඒත් එක්කම වගේ එයා දොරෙන් ඇතුල් වෙලා පඩිපෙල බැහැලා පහළට ආවේ ඉදගන්න තැනක් හොයාගෙන. ඒත් ශවුර්යා නම් එයාව දැක්කී නෑ. අන්තිම පේලියේ ඉදන් අටවෙනි පේලියේ හිටපු ශවුර්යා ළඟට ඇවිල්ලා හිටගත්තම තමයි ශවුර්යා එයාව දැක්කේ.

" කවුරුහරි ඉන්නවද මෙතන?"එයා එකපාරටම අහද්දී ශවුර්යා බයවෙලා ගියා. ඒ තරම් ගොරෝසු කටහඬක්... ඒ වගේ කටහඬක් ඇය කවදාවත් අහලා තිබ්බේ නෑ. ඒක අහපුවම ශවුර්යාට තමන් වෙවුලනවා වගේ දැනුණා. ඒ තරමටම ඒ කටහඬ ගොරෝසුයි. ශවුර්යා උත්තරයක් දෙන්න පුලුවන් තත්වෙක හිටපු නැති නිසා ශවුර්යා ඔලුව විතරක් හෙල්ලුවා. ඒත් එක්කම වගේ එයා එතනට ඇවිල්ලා ඉදගත්තා.

Lecture එකත් පැය ගානක් තිබිලා එහෙම්ම ඉවර වුණා. ඊළඟ දවසෙත් එයා එතනම වාඩි වුණා. දවස් එකින් එක ගෙවිලා ගියා. එක දවසක් එයා කලින්ම ඇවිල්ලා එයාගේ බෑග් එක එතන තියලා තිබුණා. ශවුර්යායි සෙනේශායිත් ගිහින් එතනම වාඩි වුණා.

" ඔයා අද ටිකක් කලින් ඇවිල්ලා නේද? " ශවුර්යා එහෙම ඇහුවේ lecture එක පටන් ගන්න තව වෙලාව තිබුණ නිසා.

" ඔව් ඔව්... මගේ පුටුව වෙන කාටවත් දෙන්න බැරි නිසා අද කලින්ම ආවා..."

“ ඔයාගේ පුටුව??? ” ශවුර්යා එහෙම ඇහුවේ එයා කටකොනින් සිනාවෙනවා දැකපු නිසා.

“ ඔයා lecture එක අතරේ හැමවෙලේම යාලුවා එක කියවනවා නේ... ” එයා එකපාරටම එහෙම කිව්වේ ශවුර්යා සෙනේශා එක්ක කතාවක ඉන්න වෙලාවක.

* * *

“ ඔයාලා lectures වල හැමදාම මට එහාපැත්තේ ඉදන් ඉන්නෙත්, ඒත් තාම මන් ඔයාලගේ නම්වත් දන්නේ නෑනේ ” ශවුර්යායි සෙනේශායි නෝට් වගයක් ලියන අතරෙදි එයා ඇහුවා.

“ ආ... ඔව් නේද... මම ශවුර්යා... මෙයා සෙනේශා... ම්ම්... එත්කොට ඔයා? ”

“ මන් යුවාන්... යුවාන් ස්වස්තික... ”

* * *

ඔවුන් කවදාවත් එකට පාඩම් කරේ නෑ. කොහොමහරි එයාගේ නෝට්ස් එකිනෙකා අතරේ හුවමාරු වුණා. ඇත්තටම ශවුර්යාගෙයි යුවාන්ගෙයි නෝට්ස් ගොඩක් වෙලාවට එක සමාන වුණා. එක දවසක් යුවාන් ආවේ නැති නිසා එයා ශවුර්යාගෙන් නෝට්ස් ඉල්ලා ගත්තා... ආයෙමත් දවසක්...

“ ඔයා අකුරු ලියන්නේ හරියට මේවා කොහේහරි යයි කියලා වගේනේ.... ” එක දවසක් හවස යුවාන් ශවුර්යාට එහෙම කිව්වා.

“ ඒ වගේම ඔයා ලියන්නේ හරියට ඒවාට තේරුම් තිබ්බත් නැතත් කමක් නෑ වගේනේ ” ශවුර්යා ඒකට පිලිතුරු දුන්නා.

තාමත් ඇයට එක පන්තියක්හරි මිස් උනාම ඔහුගේ සටහන්, කටු රූප ඇගේ මේසය උඩ තිබුණේ කිසිම පැහැදිලි කිරීමක්ද නැතුවම.

යුවාන්ට colour mixing වගේ තරමක් අපහසු වුණාම, painting එක නියමිත දවසට ඉවර කරගන්න බැරිවුණාම ඔහු පැවසීමටත් පෙරම ශවුර්යා ඔහුට උදව් කලා.

ඒත් ඔවුන් කිසිම වෙලාවක එකිනෙකාට ස්තූති කලේ නෑ... අඩුම තරමේ ඔවුන් එහෙම දෙයක් බලාපොරොත්තු වුණේවත් නෑ...

* * *

එදා හවස් වරුවක්. Lectures ඉවර වෙලා හැමෝම තම තමන්ගේ rooms වලට ඇවිදන් ගියා. තවත් සමහරු යාලුවෝ එක්ක වෙනත් පත්තකට ඇවිදන් ගියා. ශවුර්යා සෙනේශත් එක්ක අනිත් අයත් එක්කම ඇවිදන් ගියේ library එකට යන්න හිතාගෙන.

එ දෙන්නා ඉස්සරහටම යද්දී යුවානුත් එයාගේ යාලුවොත් එක්ක ඒ පැත්තට ඇවිදන් ආවා. එයා යාලුවොත් එක්ක අමුතු අමුතු දේවල් ගැන කතා කරා... හරියට කැම්පස් එකට වැස්සේ සුවඳ ගොඩක් වෙනස් වුණෙ ඇයි... කොමික් පොත්වල ඉන්න වීරයන්ට ගොඩක් වෙලාවට කරදරවලට පැටලෙන්න වුණේ ඇයි වගේ දේවල්...

ශවුර්යා මේ දේවල් හොරෙන්ම අහගෙන හිටියා. ඔවුන් ඉස්සරහටම ගියා. ශවුර්යායි එයාගේ යාලුවොයි කැන්ටීන් එකට ගියා. උණු උණු වඩේ සුවඳ, දුම්දාන කිරිකෝපි වල සුවඳින් කැන්ටින් එකම පිරිලා තිබුණා. ඒ හැමෝම කැන්ටීන් එකේ අයිනම තියෙන මේසයක ඉඳගත්තා. යුවානුත් අවිල්ලා ශවුර්යාට ඉස්සරහින් වාඩි වුණා.

“ම්ම්... අද අපි මොනවද කන්නේ... ” යුවාන්ගේ යාලුවා මෙතුල ඇහුවේ ලොකු ඇනුමකුත් යවන ගමන්.

“ ඒක ඇත්ත... මොනාද අපි කන්නේ ” ඒ ඇහුවේ යුවාන්. ඒත් එක්කම හැමෝම තම තමන්ට ඕනි දේවල් කියලා එක්කෙනෙක් ගියා කෑම ටික අරන් එන්න.

පැය එකහමාරක් දෙකක් වගේ එතන කතා කර කර ඉඳලා හැමෝම තම තමන්ගේ කාමරවලට ගියේ හෙට දවසට යෙදිලා තිබ්බ වැඩ ටික ඉවර කරලා දාන්න.

* * *

ඊයේ රෑ ඉඅවර කරපු චිත්‍ර ටික art room එකෙන් තියලා ශවුර්යා ගියේ library එකට.

ශවුර්යා කිසිම සද්දයක් නැතිවම library එකට ගියා. ඇගේ පාද කිසිම අනුබලදීමකින් තොරවම ඇයට යන්න ඕන වුණ තැනට අරගෙන ගියා.

Comic book section...

එය පුස්තකාලයේ ඈත කෙළවර නිහඬ අධ්‍යන පොත් රාක්ක හා පර්යේෂණ පොත්වලින් ඈත්ව ටිකක් එහාට වෙනට තිබුණා. එම රාක්ක ගෙවුණු , ඉරුණු, දිලිසෙන කවර සහිත ජීවමාන බවක් ඉහිලූ කතාවලින් පිරී තිබුණා.

ඇගේ ඇඟිලි දූවිලි පිරුණු රාක්ක දිගේ ඉදිරියට ඇදී ගියා. ඒ වෙලාවේ ඇය ඒක දැක්කා...

ස්පයිඩර් මෑන්... පොඩ්ඩක් නැමුණු පිටපතක්...

ඇගේ අත එතනම නතර වුණා. ඇගේ මුහුණ හරහා සිහින් සිනා රැල්ලක් ඇදීගියේ ඇයටවත් නොදැනීමය. ඇය එය අතට ගත්තා.

“ තාමත් බොරු පුරාජේරු කියන වීරයාවම තෝරගන්නවද? ” ශවුර්යාට පිටිපස්සෙන් ආව කටහඬක් එහෙම කිව්වා. ශවුර්යා එකපාරටම හැරුණේ නෑ. හැබැයි එය ඉස්සරහා බලාගෙනම ඒකට උත්තර දුන්නා.

“ පුරාජේරු??? ” ඇය එහෙම කියමින් පොතේ පිටු පෙරලුවා.

“ පොහොසත් වීම හා කල්පනාකාරී වීම කෙනෙකු සිත්ගන්නාසුලු කරයි ලෙස ටසිතන්නා මෙසේ කියයි... ”

දෙදෙනාගේම මුහුණේ නිහඬ හිනාවක් ඇදී ගියා.

“ ඒ වගේම බැට්මෑන්ට මොකද වෙලා තියෙන්නේ ” ඇය පිටුපසට හැරුණා.

යුවාන් එක් අතක් රාක්කයට තියන් එයට හේත්තු වෙලා හිටියා. ඔහුගෙ අනිත් අතේ තිබුණෙ කොමික් පොතක්.

“ හැමදේම...” ශවුර්යා ඇහිබැම ඉහළට ඔසවමින් කිව්වා.

“ එයා හරිම dramatic... ඒ වගේම මෝඩයි... එයාට තියෙන ප්‍රශ්න එයාම හදාගත්ත ඒවා... ”

“ අඩුම තරමේ එයාට ඇත්ත මොකද්ද්ධ කියලා දැනෙන එකවත් මදිද... ” ඇය කිව්වා.

“ එයා හරිම ලැජ්ජයි. ඒ වගෙම ගොඩක් දේවල් වරද්දගන්නවා. එයාට තියෙන්නේ පුදුම කලබලයක්... Exam fail වෙනවා. Bus මගහැරගන්නවා ” ඔහු කට කොනින් හිනාවුණා.

“ ඉතින්... ඔයා මේ වගේ දේවල්වලින්ද කෙනෙක්ව මනින්නේ...වීරයෙක්ව තෝරගන්නේ... ”

ශවුර්යා සිනාවුණා... සිහින් සිනාවක්... ඇයට ඕන වුණේ නෑ මේ නිශ්ශබ්දතාාවය බිඳලා දාන්න.

යුවාන් එයාගේ අතේ තිබ්බ කොමික් පොත දිහා බලලා ආයේ බැලුවේ ශවුර්යා දිහා.

“ සමහරවිට මන් ඔයාගේ taste එක දියුණු වෙලාද කියලා බලනවා වෙන්නත් පුළුවන් ”

ඇය යුවාන්ට රාක්කය අසලට යාමට ඉඩ දෙමින් පැත්තකට වුණා.

“ එත් කොහොමහරි... මන් නම් කියන්නේ බැට්මෑන්, ස්පයිඩර් මෑන්ට වඩා හොදයි...” යුවාන් ඉස්සරහට යන ගමන් කිව්වා.

“ නෑ... ස්පයිඩර් තමයි හොදම... එයා කොච්චර කරදරවල පැටලුනත් එයා ඕනම වෙලාවාක අනික් අය වෙනුවෙන් පෙනී ඉන්නවා. ”

“ හරි අපි බලමුකෝ ” යුවාන් එහෙම කියලා library එකෙන් එළියට ගියා.

දවස් සති ගණන් මෙහෙම්ම ගෙවිලා ගියා. දෙන්නට දෙන්නා රණ්ඩු වුණාට, විහිලු කරගත්තට ඒ දෙන්නා අතරේ තිබුණේ යාලුකමට එහා ගිය බැඳීමක්... ඒ දේ ගැන දෙන්නම දැනගෙන හිටියට කවුරුවත් ඒක ගැන අනිත් කෙනාට කියන්න ගියේ නෑ... ඒ දේ යුවානුත් දැනගෙන හිටියා... ශවුර්යාත් දැනගෙන හිටියා...

ඒ කලු ඇස් හිමි දඟකාර යෞවනයා... ඒ කෝපි පාට ඇස් හිමි සිනිඳු දේවදූතිය... හරි ලස්සන සම්මිශ්‍රණයක්...!

* * *

# 07.

යුවාන් අතුරුදහන් වෙලා දැනට මාස පහකටත් වැඩියි...ලංකාව පුරාම හෙව්වත්, දන්න දන්න හැමෝගෙන්ම ඇහුවත් ඒ කවුරුවත්ම එයාව දැකලා තිබුණේ නෑ. ශවුර්යා නිදි නැතුව අඬපු වාර අනන්තයි... ඒ හැමවෙලාවකම ශවුර්යාට යුවාන් කිව්ව හැමදෙයක්ම මතක් වුණා. යුවාන් කොච්චර නම් ශවුර්යාගෙ ඇස් වලට ආදරේ කලාද... මේ ලෝකේ කොච්චවර ලස්සන මිනිස්සු හිටියත්, ලෝකේ ලස්සනම දියමන්තිය මොකක්වුණත් යුවාන් හැමවෙලේම කිව්වේ මේ ලෝකේ එයා දැකපු ලස්සනම දියමන්ති දෙක ශවුර්යාගේ ඇස් දෙක කියලා...

යුවාන් කවදාවත් ශවුර්යාට සීරීමක්වත් වෙන්න ඉඩ දුන්නේ නෑ. එයා හැමවෙලේම ශවුර්යාව මලක් වගේ බලාගත්තා. යුවාන්ට ජීවිතේ හම්බුණ ඒ ලස්සනම ලස්සන අරලිය මල තමයි ශවුර්යා කියන්නේ...

ශවුර්යාට එක දවසක් යුවාන් අරන් දුන්න ලස්සනම ලස්සනම අරලිය කොණ්ඩ කටුව මතක් වුණා. ශවුර්යා යන හැමතැනකටම ඒක අරන් ගියා. හැමවෙලාවකම වගේ ළඟින්ම තියාගත්තා. ශවුර්යාගේ කඩා හැලෙන කොණ්ඩය සුළඟත් එක්ක උකුළු මුකුළු කරනවාට ලෝභකරපු යුවාන් ඒ සිහින් කොණ්ඩ රැලි ටිකක් එකට අල්ලලා ගහපු ඒ සුදු පාට අරලිය

කොණ්ඩ කටුව නැති කරගන්න ශවුර්යා කවදාවත් කැමති වුණේ නෑ.

ඒ වගේම යුවාන් ශවුර්යාට ඇඳලා දුන්න චිත්‍ර තාමත් ශවුර්යා ලග තිබුණා. රොබරෝසියා වසන්තයේ එක් දවසක... " මම දැකපු ලස්සනම රොබරෝසියා මල තමයි ඔයා ශවුර්යා..." කියලා යුවාන් කියලා ශවුර්යාගේ පැත්තකට කරලා කන ලගින් ගහපු මල ශවුර්යා කැමතිම කොමික් පොත ඇතුලේ තවමත් තිබුණා... ඒ කිව්ව වකහන ඇගේ මතකයේ තාම එහෙමම ලියවිලා තිබුණා...

කැම්පස් එකේ තිබුණ " ශ්වේත වර්ණ තිර " චිත්‍ර ප්‍රදර්ශනයේ යුවාන්ගේ චිත්‍රය 1st place දිනාගත්තා. ඒ චිත්‍රයේ ඉන්නේ වෙන කවුරුවත් නෙමෙ. එදා රොබරෝසියා මට දුන්න වෙලාවේ හිටපු වලගැහෙන කම්මුල් හිමි ඒ ආඩම්බරකාර ගැහැනු ආත්මය... ශවුර්යා කියලා මතක් වෙද්දිම ඇගේ හදවත තව තවත් ආලයෙන් නැහැවී ගියා.

ඒත් දැන්... යුවාන් කොහේද ඉන්නේ කියලාවත් ඇය දන්නේ නෑ...

සිතුවම් කිරීම විතරක් තමන්ගේ මුළු ලෝකයම කරගෙන හිටපු ශවුර්යා දැන් මාස ගාණකින් පින්සලක් වත් අතින් අල්ලලා නෑ. චිත්‍ර ඇඳීම දැන් ඇගේ මනසින්ම ඉවත් වෙලා ගිහින්.

ශවුර්යා අන්තිම පාරට සුවපහසු ඇඳක නින්දට වැටී තිබුණේ... හොඳයි... ඇයට එහෙම දවසක් ගැන මතකයක්වත් තිබුණේ නෑ... ඇයට ගෙවන්නට ලැබුණු උමතු දවස් හා ඇගේ

ඔලුව ඇතුලේ දුවමින් තිබුණ මිලියන ගානක සිතුවිලි පැත්තකට දමා ඇය තම සිරුරේ පාලනය අතට ගත්තා...

ඇත්ත වශයෙන්ම ඇයට සිහින පෙනුනා. ඇය කවදත් සිහින දැක්කා. ඒත් ඒවා දුම්රිය කවුළුවකින් දකින බොඳ වූ රූප වගේ වේගයෙන් ඉවතට ඇදිලා ගියා.

* * *

එදා ශවුර්යා උදෙන්ම සරසවි උයන ස්ටේශන් එකට ගියේ නුවරින් පහට යන කෝච්චියට නැග්ලා කොළඹ යන්න කියලා හිතාගෙන. කෝච්චිය ආව ගමන් ඒකට නැගලා ජනේලයක් අයිනේ තිබුණ ශීට් එකකට යන්න ඕන කියලා ශවුර්යා හිතා ගත්තා. ශවුර්යාට යුවාන්ව කෙතරම් මතක් වෙනවාද කියනවා නම් එයාට යන ගමනවත් යන්න හිත දුන්නේ නෑ. Colombo වල ඉන්න ප්‍රසිද්ධ කලාකරුවෙක්ගේ 57 වන birthday එකට organize කරලා තිබුණ art exhibition එකට කරපු ආරාධනාව නොසලක හරින්න බැරි නිසාමයි ඇය මේ ගමන යන්නේ. ශවුර්යා බලාපොරොත්තු වුණා සමහර විට එයාට යුවාන්ව මේ යන අතරමගදීවත් හොයාගන්න පුලුවන් වෙයි කියලා.

කැම්පස් එක ළඟම තියෙන සරසවිඋයන ස්ටේශන් එක නුවර තියෙන ලස්සන තවත් වැඩි කරන තැනක්. ස්ටේශන් එක දෙපැත්තේ තියෙන මැයි මාරගස් හරියට දිව්‍යලෝකෙන් ආව දිව්‍යාංගනාවෝ වගේ.

ශවුර්යාට ඈතින් එන කෝච්චියේ සද්දේ ඇහුණා. ඒත් එක්කම තත්පර දහයක් යන්නත් කලින් කෝච්චිය ස්ටේශන්

එකට ආවා. කෝච්චියට නගින්න එක්තරම් සෙනගක් හිටියේ නැති වුණත් ඇය ඉක්මනින්ම ගිහින් හතරවෙනි පෙට්ටියට නැග්ගා. කෝච්චි පෙට්ටියේ තැන් තැන්වල ශීට් හිස්ව තිබ්බා. ශවුර්යාට ජනේලෙ ලඟ ශීට් එකක් හම්බුණ නිසා එයා ගිහින් ඒකේ ඉඳගත්තා. විනාඩි පහක් දහයක් වගේ කෝච්චිය නවත්තන් ඉඳලා කෝච්චිය පිටත් වුණා.

කලු පාලම, කඩුගන්නාව පහු කරන් කෝච්චිය ඉදිරියටම ගියා. ශවුර්යා ආයේ අයෙත් කල්පනා කලේම යුවාන් ගැන. ඒත් තාම කාටවත්ම එයා ගැන විස්තරයක් හොයාගන්න බැරිවෙලා තිබුණා. අඩුම තරමේ පොලීසියටවත්... කඳු හෙල්, කුඹුරු පහු කරගෙන කෝච්චිය ඉදිරියටම ඇදුණා. අනෙක් මිනිසුන් සාමාන්‍ය දවසක් ගත කලත් ශවුර්යා දුක් කන්දරාවක් හිතේ තදකරගෙන හරිම අමාරුවෙන් දවස ගත කලා.

පැණිදෙනිය, පිළිමතලාව, කඩුගන්නාව, කටිගමුව, රඹුක්කන පහුකරන් කෝච්චිය ඉක්මනට පොල්ගහවෙලටත් කිට්ටු කලා. කෝච්චිය වේගේ ටිකින් ටික අඩු කලේ පොල්ගහවෙල ස්ටේශන් එකෙන් නවත්තන්න ඕන නිසා. ශවුර්යා ජනේලයට ඔලුව හේත්තු කරන් එළිය බලාගෙනම ගියා. එකපාරටම අකුණක් ගැහුවා වගේ ශවුර්යා කෙලින් වුනේ දැක්ක දේ හිතාගන්නවත් බැරිව. ශවුර්යා වේගයෙන් ඇස්පිල්ලම් ගැහුවා. ශවුර්යා අයේමත් පාරක් ජනේලයෙන් බැලුවේ එයාගේ හිතේ තිබුණ සැකේ නැති කරගන්න. මේ දේවල් යන්න ඕන්නම් තතොඅර පහක් යන්න ඇති. ශවුර්යා එකපාරටම ඉදන් ඉන්න තැනින් නැගිට්ටෙ එයාටවත් නොදැනීම. ඒත් එක්කම වගේ කෝච්චිය නතර කලා. ශවුර්යා ඉක්මනින්ම කෝච්චියෙන් බැහැලා දුවගෙන ගියේ ඒ දැක්ක

කෙනා ළඟට. ඔව් ඒ යුවාන්ම තමයි... සුදු පාට පෝලෝ ටී ෂර්ට් එකකින් හා ඩෙනිම් එකක් ඇඳලා හිටපු එයා යුවාන්ම තමයි. ඒ උස, ඒ අවුල් වුණ කොණ්ඩය, ඒ කලුපාට ඇස්, හිනාවෙද්දී වලගැහුනු කම්මුල්... ඒ එයාම තමයි... ශවුර්යාට දැනුණ සතුට එයාට දරාගන්නවත්ග් බැරිවුනා. මෙච්චර කාලයක් එයාව හොයාගන්න කොයිතරම් මහන්සි වුණාද... ඒත් දැන්... ශවුර්යා පුලුවන් උපරිම වේගෙන් දුවගෙන ගිහිල්ලා එයාව තම දෑතින්ම වළඳගත්තා... එකායි... දෙකායි... තුනායි... වැඩිඅම තත්පර තුනක් එහෙම ඉන්න ඇති. ඒ තරුණයා එකවරම ඇගේ අත් ගසා දැමුවා. ශවුර්යාට මේ ඇයි කියලාවත් හිතාගන්න බැරිවුණා. ස්ටේශන් එකේ හිටපු හැමෝගෙම ඇස් යොමුවෙලා තිබුණේ මේ දෙන්නා දිහාවට. ඒත් එක්කම ඒ තරුණයා අඩි දෙකක් විතර ඇගෙන් ඈත් වුණේ යම් දෙයක් කියන්න.

“ Excuse me miss... ඔයා කවුද? ” ගොරෝසු කටහඬකින් එයා එහෙම කිව්වා.

“ මේ... මේ... යුවාන් නේද? ” ශවුර්යාගේ කටහඬ වෙව්ලුවා. ඇගේ ඇස්වලින් කඳුළු කැට ගලන් ආවේ ඇගේ වචන ගොතගැහෙද්දී.

“ Sorry miss... ඔයාට මොකක්හරි වැරැද්දක් වෙලා තියෙනවා... ” ඔහු කිව්වා

ශවුර්යා විතරක් නෙමේ ඔහුත් අවට හිටපු සෙනගත් කෝච්චියේ හිටපු සමහර මිනිස්සුත් තුෂ්ණිම්භූත වෙලා බලාගෙන හිටියා. “ එහෙ... නම්...ඔ...ඔයා...කවුද? ” ශවුර්යා ඇහුවේ තම දෑතින්ම කඳුළු පිහදාගන්න ගමන්.

“ මම දිසස් මැදගෙදර... මම මිස් හොයන යුවාන් නෙමේ...Sorry... ” එහෙම කියපු ඔහු එතන හිටපු සෙනඟ අතරින් නොපෙනී ගියා. ශවුර්යාට ඒ වෙලාවේ තමයි තේරුණේ එයාට ලොකු වැරැද්දක් වෙලා තියෙනවා කියලා. ඔහු සැම අතින්ම යුවාන්ට සමාන වුණා. ඇයට මෙතන කෑගහලා අඩන්න හිතුණත් එයා ඒක හිතේ තද කරගෙන අයේමත් කෝච්චියට ගියේ වෙන කරන්නම දෙයක් නති නිසයි.

ශවුර්යාට එහාපැත්තේ එයාගෙම වයසේ එහෙම නැත්තන් අවුරුදු කිසිපයක් වැඩිමල් ගැහැනු කෙනෙක්. ශවුර්යා ගැන එයාටත් ගොඩක් දුක හිතෙන්න ඇති.

“ මටත් මේ වුණ දේ ගැන ගොඩක් දුකයි... ” ඇය ශවුර්යාගේ අතින් අල්ලන් එහෙම කිව්වේ ඇයව සනසන්න කියලා හිතාගෙන.

ශවුර්යා ඇයට සිදුවුන හැමදෙයක්ම කිව්වා. එකිනෙකාව හඳුනන්නේ නති වුනත් මේ ටික වෙලාවට එයාලා ගොඩක් සමීප වුණා.

“ මම ලෙහාශා... ඔයාට වඩා අවුරුදු තුනක් වැඩිමහල්... ” ඔවුන් දෙන්නාම තම තමන්ගේ විස්තර හුවමාරු කර ගත්තා.

ඊට පස්සේ ශවුර්යා යුවාන්ගේ පොටෝ එකක් ලෙහාශාට පෙන්නුවේ එයාව කොහේහරි දැක්කොත් ශවුර්යාට පණිවිඩයක් දෙන්න කියලා. ලෙහාශාත් ගියේ Colombo වලට එයාගේ passport හදාගන්න England යන්න. ඉතින් දෙන්නම

කොළඹ කොටුවෙන් බැහැලා එයාලගේ කටයුතු කරගන්න වෙන් වෙලා ගියා.

* * *

# 08.

වැස්ස නිහඬවම මහපොළොවට ඇදී වැටුණා.

එය එතරම් සෝෂාකාරී වුයේ නැත. නමුත් ඇගේ ඇඳ අසල ජනේලයට වැහි බිඳු ඇදී වැටෙමින් මෘදු හඬක් නැගුණා. හරියට සෙමෙන් කවුරුන්හෝ තට්ටු කරනවාක් මෙනි. එය හරියට ඇගේ අවධනය දිනා ගැනීමට නගන හඬක් මෙන් විය.

ඇය එම හඬ නොසලකා හැරියා.

ඇගේ කාමරය නිහඬය. ඕනාවටත් වඩා නිහඬ විය. ඇගේ මේසය මත හිස් කඩදාසි කිසිපයක් තැන තැන දමා තිබුණා. ඒ අසල දූවිලි රැඳුනු පින්සල් කිහිපයක්ද බෝතලයක දමා තිබුණා.

සියල්ලම සිදුවූ දැනට වසර කිහිපයක්ම ගත වී තිබුණි. ඇගේ දෑත්වල වර්ණ ජීවත් වූ කාලය දැන් මරණයට ගොසින්ය. සෑම සිතුවිල්ලක්ම ජීවමාන කරපු ඇගේ දෑත් දැන් නිසොල්මන්ය. ඒත් ඉස්සර... හැමදෙයක්ම වෙනස් වෙන්න කලින්... එදායින් පස්සේ ඇය සියල්ලම අතහැර තිබුණි.

එක චිත්‍රයක්වත්

එකම එක කටු සටහනක්වත්

අඩුම තරමේ තනි ඉරක්වත් ඇය ඇන්දේ නැත...

නමුත් ඇය සිතුවම් එකතු කිරීම නවතා දැම්මේ නෑ. ඒත් ඇය... ඇගේ ආත්මයම වෙලාගෙන තිබුණ ඒ සුන්දර කලා ජීවිතයෙන්ම අතහැර දමා තිබුණා.

සිදුවූ දේවල් ගැන ඇයට කිසිදු නිනව්වක් නැත. දින, සති, මාස, අවුරුදු ගෙවිලා ගියේ හරියට ඇහිපිල්ලමක් ගහන පමාවට වගේ. යුවාන් අතුරුදහන් වෙලා දැනට අවුරුදු තුනක්ම ගෙවිලා ගිහින්. ශවුර්යාට කෙතරම් proposal ආවත් එයා ඒ එකකටවත් කැමති වුණේ නෑ. ශවුර්යා ඉල්ලීම් නොසලකාහරින්න බැරිම තැන art exhibitionවලට සහභාගී වුණත් ඇය එකදු චිත්‍රයක් හෝ ඇන්දේ නැත. ඇය දැන් උපාධිධාරිනියක්. දැන් ඇය තමාගේම business එකක් පටන් ගෙන තියෙනවා. ඒ කොහොමවුණත් ඇගේ හිතෙහි නැවත නැවතත් දෝංකාර දුන්නේ යුවාන් ගැන සිතිවිලි පමණි.

ඒ ඉරිදා දවසක්... එදාට කිසිම වැඩක් යෙදිලා තිබුණේ නැති නිසා ශවුර්යා ගෙදරට වෙලා හිටියේ අලුතින් ආව comic seriesෙක කියවන්න කියලා හිතාගෙන. සාලේ අයිනක ලොකු ජනේලය ළඟ තිබුණ සෝපාවේ ශවුර්යා ඇවිල්ලා ඉඳගත්තේ comic පොත් දෙක තුනකුත් අරගෙන. ශවුර්යාගේ පෝන් එක එයා ළඟම තිබුණා. ටික වෙලාවක් පොත කියවන් යද්දීම ශවුර්යාගෙ පෝන් එකේ notification එකක සද්දයක් ඇහුණ නිසා එයා පෝන් එක අතට ගත්තේ ඒ මොකක්ද කියලා බලන්න. එතකොට තමයි දැක්කේ notification bar එකේ instagram එකෙන් ආව request වගයක් පෙන්නනවා. ශවුර්යා එහෙම්ම පොත පැත්තකෙන් තියලා instagram එකෙන් ඇවිල්ලා තිබ්බ request බැලුවේ ඒ කවුද කියලා බලාගන්න.

Yuwass_verse22

ඒකේ උඩින්ම තිබුණේ Yuwass_verse22 කියලා කෙනෙක්ගේ request එකක්. ශවුර්යා ඒක accept කරන්න කලින් profile එකට ගියේ මේ කවුද කියලා දැනගන්න.

follow back කරන්නේ නැතිව දාලා තියෙන post මොනවද කියලා බලන්න බැරි නිසා ශවුර්යා ඒ account එක follow back කරා. පෝන් එක එහෙම්ම තියලා ශවුර්යා අයේත් පොත කියවන්න පටන් ගත්තා.

පොත කියවලා ඉවර වෙලා කුස්සියට ගියපු ශවුර්යා ඊයේ හවස ගෙනාවපු ස්නැක්ස් පැකට් එකකුයි ෆ්‍රිජ් එකේ තිබුණ soft drink එකකුත් අරන් අරන් ආයෙත් ජනේලය ළඟ තිබුණ සෝෆා එකට ආවා. පෝන් එක අරන් spotify සිංදු දාගෙන ශවුර්යා අයෙත් ගියේ instagram එකට. ශවුර්යා දැක්කා Yuwass_verse22 කියන account එක එයාගේ request එක accept කරලා තියෙනවා. Account එකට ගියාම එක post එකක් විතරක් ශෙයා කරලා තිබුණා. එක post එකක් වුණාට ඒකේ තිබුණේ ලස්සන චිත්‍ර ගොඩක එකතුවක්. හිතාගන්නවත් බැරි තරම් ලස්සන චිත්‍ර ගොඩක් ඒකේ තිබුණේ. මේ චිත්‍ර දකිද්දී ශවුර්යාගේ හිතට අමුතු හැඟීමක් දැනෙන්න ගත්තා. ඒත් ඒ මොකක්ද කියලා එයාට තේරුම්ගන්න බරි වුනා. Post එකේ එහාට යද්දි ඇගේ අත නතර වුණේ එක art එකක ළඟ.

ඒ රූමත් තරුණියකි. කැන්වස් රෙද්දක ඇඳ තිබුණ ඒ චිත්‍රයේ සිටි තරුණිය මැදි වයසැති කෙනෙක් වෙන්නැති කියලා ශවුර්යාට හිතුණා. රෝස පාටට හුරු ගවුමකින් සැරසී සිටි ඇය රොබරෝසියා ගහක් යට රෝසපාට මල් පලසක් මත හුලඟට වැටෙන මල් ඇල්ලීමට සුළඟත් සමඟ දඟකාරකම් පාමින් හිටියා. චිත්‍රයේ වම්පසට වෙන්නට ඇගේ පෙම්වතා යැයි සිතිය හැකි තරුණයෙක් කුඩා කැමරාවක්ද අතේ තියාගෙන ඇගේ

ඡායාරූපයක් ගනීමට සැරසෙමින් හිටියා. එහි පහළ වම් කෙළවර සිත්තරුවාගේ අත්සන දමා තිබුණද එය හඳුනාගත නොහැකි වන පරිදි අපැහැදිලි කර තිබුණි.

ඒත් එක්කම වගේ ලෙහාශාගෙන් ශවුර්යාට message එකක් ආවා.

“ හායි... කොහොමද ඉතින්... ”

“ හොදින් ඉන්නවා අක්කේ... ගොඩක් කාලෙකින් නේද ”

“ මමත් හොදින් ඉන්නවා නංගී... මට ඔයාටත් කියන්න බැරි වුණානේ... මට England වල job එකක් හම්බුණා... මන් ලඟදීම ලංකාවට එන්න කියලා හිතන් ඉන්නේ... එතකොට ඔයාවත් බලලා යන්න එන්නම්කෝ... ”

..............

මෙහෙම අපි දෙන්නා message කර කර ඉද්දී දන්නේම නැතුව රෑ වෙලත් තිබුණා. ටික වෙලාවකට පස්සේ Stranger Things episode එකක් බල බල ඉද්දීම තමයි ආයෙමත් සැරයක් Instagram එකේ notification එකක් ආවේ. ශවුර්යා දැක්කා Yuwass_verse22 කියන account එක අලුත් post එකක් ශෙයා කරලා තියෙනවා.ශවුර්යා ඒක ටච් කරලා එයාගේ profile එකට ගියා.

ඒ තවත් චිත්‍රයක්...

වැස්සට බොඳවුණු රූපයක් පාළු පාරක් දිගේ ඉදිරියට ඇවිදගෙන ගියා. ඒ කාන්තාවකි. ඇය අතෙහි කුඩයක් තිබුණද ඇගේ අත පහළට වැටී තිබුණි. වැස්සට තෙමුනු ඇගේ ගවුම

දණහිස පමණ දිගු එකක් විය. වැහි පොද දර්ශනය හරහා බිම පතිත වී පාර දිගේ ගලා ගියා.

ශවුර්යාගේ හදවත ඩිග්... ඩිග්... හඬක් නගමින් වේගයෙන් ගැහෙන්නට වුණා. ඇගේ දෑත්ද සීතල විය. ඇයට අමුතු හැඟීමක් දැනුණද ඒ කුමක්දැයි ඇයට වැටහුණේ නැත.

Post එකට පහළින් මෙහේ සටහන් වී තිබුණි.

*" Some people just don't leave... They just become strangers in your memories... "*

** * **

ශවුර්යාගේ මතකය නැවතත් යුවාන්ව හම්බුණ මුල්ම කාලෙට ගියා. දැන් ඔවුන් දෙදෙනා හොඳම යලුවෝ. ස්මහර විට යාලුකමටත් එහා ගිය දෙයක් වෙන්නැති.

දවසක් යුවාන් ශවුර්යාට කිව්වදේ ඇයට ආයෙත් මතක් වුණා. ඔහුගේ හඬ සියුම් නමුත් සන්සුන් විය.

" ශවුර්යා... ඔයා දන්නවද... චිත්‍ර අඳින හැම කෙනෙක්ම කලාකාරයෙක් වෙන්නේ නෑ කියලා. චිත්‍රයක් අඳින්න පුලුවන් වුණාට විතරක් මදි ඒ චිත්‍රය ජීවමාන කරන්න බැරිනම්. ඒ විතරක් නෙවෙයි. චිත්‍රයක් ඇඳලා විතරක් මදි ඒකට ගැළපෙන වර්ණ ගලපලා ඒ හැඟීම් චිත්‍රය තුල ජීවමාන කරන්න බැරිනම්. ජීවිතෙත් එහෙමයි ශවුර්යා... පුංචි පුංචි ඉරිකෑලි එකතු කරලා චිත්‍රයක් ඇන්දට වැඩක් නෑ හරියට වර්න ගළපලා ඒක පාට කරන්න බැරිනම්. මේ පුංචි ඉරි කෑලියි, වර්ණයි කියන්නෙ හරිම ලස්සන combination එකක්. එතිම්, මගෙ ජීවිතෙත් හරියට පාට කරලා නැති ඉරි කෑලි ගොඩක් විතරක් තියෙන අසම්පූර්ණ

චිත්‍රයක් වගේ... ශවුර්යා... මන් ඔයාගෙන් එකම එක දෙයක් ඉල්ලන්නද... ඔයාට පුලුවන්ද මේ ඉරිකැලි ගොඩකින් විතරක් පිරිලා තියෙන මගේ ජීවිතේට වර්ණ එකතු කරලා හරි ලස්සනට සම්පූර්ණ කරලා පාට කරන්න... ”

ඒ වෙලාවේ යුවාන්ගේ මූණ ශවුර්යාට ආයෙ ආයෙත් මැවිලා පෙනුණා. ඒ වේලාවේ යුවාන්ගේ ඇස් දිලිසුණා. ඒ මූණේ තිබුණ අහිංසකකම දැක්කම ශවුර්යාට මොකුත් නනොකියම බැරිවුණා. ඒ දෙන්නා මහම්බෙලා මාස කීපයක් වුණාට යුවාන් ශවුර්යාව ගොඩක් තේරුම් අරගෙන තිබුණා. ශවුර්යාත් එහෙමයි. දෙන්නට දෙන්නා අතරේ තිබුණේ හරි ලස්සන තේරුම්ගැනීමක්...

* * *

එදා උදෙන්ම ශවුර්යාට ඇහුණා කවුරුහරි ගෙදර බෙල් එක ගහනවා. ඇය කුස්සියේ වැඩත් පැත්තකට දාලා ගියේ ඒ කවුද කියලා බලන්න. දොර ළඟට ගියපු ඇය දොර ඇරලා බැලුවත් එතන කවුරුවත් හිටියේ නෑ. ඒත් ශවුර්යා බිම බලද්දීම දැක්කා දොර ළඟ බිම මොකක්හරි පාර්සල් එකක් තියෙනවා. පාර්සල් එක අතට අරගෙන වටපිටාව බැලුවත් කවුරුවත් පේන්න හිටියේ නෑ. සමහර විට මේක ගෙනාව කෙනා ඒක මෙතනම තියලා යන්න ඇති.

ශවුර්යා පාර්සල් එක අතට අරගෙන ගේ ඇතුලට ගිහින් සෝෆා එකේ ඉදගත්තේ පාර්සල් එක ඇතුලේ තියෙන්නේ මොකක්ද කියලා බලන්න. පාඑසල් එකේ නමක් ලිපිනයක් තිබුණේ නැති නිසා ශවුර්යා ඉක්මනට පාර්සල් එක කැඩුවේ ඇතුලේ තියෙන්නේ මොනවද කියලා බලන්න.

ඇතුලේ තියෙන දේ දැක්කම ශවුර්යාට හිතාගන්න බැරිවුණා. ඒක prame කරපු අඩි එකහමාරක් විතර දිග අඩියක් විතර පළල ලොකු චිත්‍රයක්. කාන්තාවක් හා පිරිමියෙක් පාලමක් උඩින් ඇවිද යමින් සිටි අතර ඔවුන් එකම වර්නයේ ඇඳුම්වලින් සැරසී හිටියා. පාලම එහා කෙළවරේ විශාල ජැකරැන්ඩා ගසක් තිබුණා. එතන බිම දම්පාට පලසක් මෙන් පෙනුණි. ඔවුන්ගේ දෑත් එකිනෙක තදින් වෙලී තිබුණු අතර ජ්වුන් අතර වූයේ යම්කිසි දුරස්ථ බවකි. ඔවුන්ට ඉහළින් කුරුල්ලන් රංචුවක් පියඹායමින් හිටියා. තරුණිය අත රතු රෝසමල් පොකුරක් තිබුණු අතර තරුණියගේ යැයි සිතිය හැකි අත්බෑගයක් එම තරුණයාගේ අතෙහි විය.

ශවුර්යා චිත්‍රය හොඳින් බැලුවේ මෙහි අයිතිකරුගේ කිසිදු සටහනක් ඇතිදැයි සෙවීමටය. නමුත් අවාසනාවට වගේ චිත්‍රය පිටිපස්සේ වත් පාර්සල් එකේ වත් කිසිම දෙයක් තිබ්බේ නෑ. ශවුර්යාගේ සිතෙහි ඇතිවූයේ කුතුහලයකි. මේක ඇන්දේ කවුද??? ශවුර්යාට මේක එව්වේ කවුද??? මේක ඇන්ඳ කෙනා එයාගේ address එක හොයාගත්තේ කොහොමද??? මේ හැමදෙයක්ම ශවුර්යාට ලොකු ප්‍රශ්නයක් වුණා.

දවසින් දවස සතියෙන් සතිය ගෙවිලා ගියා. හිතාගන්නවත් බැරි දිවියට ශවුර්යාට සැරින් සැරේ මේ විදිහට නාඳුනන්නෙකුගෙන් චිත්‍ර ලැබුණා.ශවුර්යාට මේක ලොකු ගැටලුවක් වෙලා තිබුණත් එයා මේ ගැන කාටවත්ම කිව්වේ නෑ. ඒ සැරින් සැරේ ලැබෙන චිත්‍ර එක තැනක අසුරා තැබුවත් ඇය තවමත් චිත්‍ර අඳින්න තරම් හොඳ මානසිත මට්ටමක හිටියේ නෑ. ඇගේ නිවසට පැමිණෙන මිතුරන්, නෑදෑයින් මරී චිත්‍ර ඇන්දේ එයාද කියලා ශවුර්යාගෙන් හන හැමවෙලාවකම එයා කිව්වේ මේවා තමන් මිලට ගත්ත එවා කියලා. ඒත් මේ තරම් ලස්සන චිත්‍ර හම්බෙන්නේ කොහෙන්ද කියන එක ශවුර්යාට පවා ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණා. ඇගේ මිතුරන්ටද නෑදෑයින්ටද එක

ප්‍රශ්නයක් තිබුණා. මේ තරම් දක්ෂ චිත්‍ර ශිල්පිනියෙක් වුණ ශවුර්යා තමන්ට චිත්‍ර අඳින්න පුලුවන්කම තියෙද්දිත් වෙන අයගේ චිත්‍ර මිලදී ගන්නේ ඇයි කියන එක. ඒ ප්‍රශ්නෙ අහන හැමවෙලාවෙම ශවුර්යා කිව්වේ තමන් ලස්සන චිත්‍ර මිලට ගන්නවා මිසක් වෙන දෙයක් නෑ කියලා. පස්සේ පස්සේ ඒ හැමෝම ඒ ගැන අහන එකිඅ න්තර කලා විතරක් නෙමේ ඒ ගැන අමතක කරලම දැම්මා.

ශවුර්යා තිබ්බ ලොකුම ප්‍රශ්නය තමයි මේ හැංගිමුත්තන් කරන රහස් සිත්තරා කවුද කියන එක... තමන් කවුද කියලා කිසිම ඉඟියක්වත් දෙන්නේ නැතුව මේ වගේ සතියෙන් සතිය ශවුර්යාට චිත්‍ර එවන්නේ ඇයි කියන එක... ශවුර්යා මේ රහස් සිත්තරුවාගේ විස්තර හොයන්න කොයිතරම් උත්සාහ කරත් ඒවායින් කිසිදු පලක් වුණේ නෑ. ඒත් එක දෙයක් පැහැදිලි වුණා. මේ එවන හැම චිත්‍රයකම outline එකට ඉරි දෙකක් යොදාගෙන තිබුණා. ඒ විතරක් නෙමේ චිත්‍රයේ පහළ කෙළවර එක සමාන තීරුවක් blur කරලා තිබුණා. ඇයට හම්බවුණ හැම චිත්‍රයකම එහෙම කරලා තිබුණා. සමහර විට ඒ රහස් සිත්තරුවාගේ අනන්‍යතාවය වෙන්න ඇති. ශවුර්යා Art Gallery කිහිපයකටම ගිහින් මේ වගේ watermark එකක් තියෙන චිත්‍ර කොපමණ හෙව්වත් ඒ එකක්වත් හම්බුණේ නෑ. ඒත් මේ සිත්තරා ඒ චිත්‍රවලට ජීවමාන භාවයක් එකතු කරලා තිබුණා. ඒවා මිනිස් හැඟීම් ජීවමාන ආකාරයටම මවාපෑවේ හරියට හිත් කියවනවා වගේ.

ශවුර්යා post office එකට ගිහින් බැලුවත් මේවා එවන්නේ කවුද කියලා එයාට හොයාගන්න බැරිවුණා. ඇයට දිගින් දිගටම චිත්‍ර ලැබුණා. එයා ඒ හැම එකක්ම පරිස්සම් කරලා තියා ගත්තේ කවදාහරි දවසක ප්‍රයෝජනවත් වේවි කියලා. දැන් ශවුර්යා ළඟ මේ වගේ චිත්‍ර පහළොවකටත් වැඩිය තියෙනවා.

ඒත් එක දවසක් මෙහෙම හම්බුණ පාර්සල් එක ඇතුලේ නවපු කොල කැල්ලක් තිබුණා. ඒ කොල කැල්ල ශවුර්යා අතට අරගෙන ඒක දිගහැරියේ කියවන්න කියලා හිතාගෙන.

ශවුර්යා,

ඔයාට ලොකු ප්‍රහේලිකාවක් වෙන්නැති නමක්, ගමක්, ලිපිනයක්වත් නැතිව සැරින් සැරේ චිත්‍ර එවන්නේ කවුද කියන එක. සමහරවිට ඔයා මාව දන්නවත් ඇති නැතිවත් ඇති. ඒ කොහොම වුනත් ඔයාගේ address එක හොයාගත්තේ කියන එක මන් පස්සේ දවසක කියන්නම්. ශවුර්යා... ඔයාගේ හැම ප්‍රශ්නයකටම උත්තර ලඟදීම දවසක හම්බවෙයි. ඔයාට මගේ විස්තර කියන්නේ නැති එකට මට සමාවෙන්න. හබැයි දවසක මේ හැමදෙයක්ම ඔයාටම තේරුම්ගන්න පුලුවන් වෙයි.

ප.ලි : දැන් අවුරුද්දක් පුරාවටම මන් මේ වගේ ඔයාට චිත්‍ර එවනවා. ඒ එකකවත් මගේ address එක සඳහන් නොකලේ එක හේතුවක් නිසා. ඒ මොකක්ද කියලත් මන් පස්සේ කියන්නම් ඔයාට. මන් මේ ලිව්වේ අන්තිමට මගේ address එක ලියලා එවන්නම්. හැබැයි ඔයා මාව හොයන් එන්න එපා. මේ හැමදෙයකමට උත්තර ලැබෙනකන් ඉවසන් ඉන්න.

මීට,

රහස් සිත්තරා,
243/B,
වැල්ලවත්ත,
කොළඹ

# 09.

ශවුර්යා එදා එයාට හම්බුණු ලියුම පරිස්සම් කරලා තියා ගත්තා. ඇයට ආයෙත් චිත්‍ර දෙක තුනක් හම්බුණත් ඒ එකපාරකවත් එයාට ලිවුමක් හම්බුණේ නෑ.

ශවුර්යා දක්ෂ කලාකාරිනියක් කියලා ගොඩක් අය දැනගෙන හිටියා. ඒ නිසාම එයාට ඇගේම art exhibition පවත්තන්න කියලා ගොඩක් අය ඉල්ලීම් කරලා තිබුණා. ගොඩක් දෙනා කාලයක් තිස්සේ එයාට letters, emails එවලා තිබ්බත් ඒ කිසිම දේකට ශවුර්යා හරි ප්‍රතිචාරයක් නොදැක්වූයේ එයා චිත්‍ර කියන කලාව හිතින්ම අතහැරලා දාලා තිබුණ නිසා.

ඒත් සිය ගණනක් ලැබුන ඉල්ලීම් නිසාම ශවුර්යා තීරණය කලා art exhibitionඑකක් පවත්තන්න. ශවුර්යා එයා දන්න හමෝටම invitations යැව්වේ එයාලටත් මේකට එයාලගේ arts ඉදිරිපත් කරන්න කියලා.

ඒ වගේම තමයි එයාට මේ චිත්‍ර එවන නමක් නොදන්න රහස් සිත්තරාටත් ආරාධනා කරන්න අමතක කලේ නෑ. එදා ලිවුමේ තිබුණ address එකට පළවෙනි පාරට ලිවුමක් යැව්වත් දවස් ගානක් යනකල්ම එයාගෙන් තොරතුරක් ලැබුණේ නෑ. ආයේ චිත්‍රවත් ලිවුම්වත් ලැබුණේ නැති නිසා ඔහුගේ පැමිණීම ඇය එතරම් බලාපොරොත්තු වුණේ නෑ.

හෙමින් හෙමින් ඒ දවස උදාවුණා. කොළඹ BMICH එකේ මේක පවත්තන්න හැමදෙයක්ම ලෑස්ති කරලා තිබුණා. උදේ වෙද්දී නන්දෙසින් පැමිණි කලාකරුවන්ගෙන් ශාලාවම පිරී තිබුණා. ශවුර්යාගේ මිතුරන්, නෑදෑයින්, දක්ෂ චිත්‍ර ශිල්පීන් හැමෝම මේකට ඇවිල්ලා තිබුණා.

# 10.

ඔව්... මේ ඒ ඇස්ම තමා...!

දින, සති, මාස, අවුරුදු ගාණක් බලන් හිටපු ඒ ඇස්... ඔව්... මේ ඒ කලු පාට මායාකාර ඇස්ම තමා...

ශවුර්යාගේ හදවත තව තවත් වේගෙන් ගැහෙන්නට විය. ඇයට තමා ඉන්න තැන පවා අමතක වී ගිහින් තිබුණේ. ශවුර්යා මේ හමුවීම මේ වගේ වෙයි කියලා කවදාවත් හිතුවේ නෑ. ඒ විතරක් නෙමේ අඩුඅම් තරමේ ඇයට ඔහුව ආයෙ දකින්නවත් පුලුවන් වෙයි කියලා...

ඔව්... මේ යුවාන් තමා...!

ශවුර්යාගේ හදවත තව තවත් වේගයෙන් ගැහෙන්නට විය. කඳුළු බිංදු කම්මුල් හරහා පහළට ඇදී ආවේ ඇයටත් නොදැනීමය.

මේ මොහොත ඇය හීනෙකින්වත් බලාපොරොත්තු නොවිණි. හයියෙන් කෑගහලා අඬන්නද නැතිනම් සිනාසෙන්නටද කියා හෝ ඇයට නොතේරේ...

ඇයට හිතුණේ මේ හීනයකැයි කියාය. ඇය රහසේම තම අත කොනිත්තා ගත්තේ මේ හීනයක් නොවන බව හරියටම තහවුරු කරගැනීමටය. ඇය සෙමෙන් අත

කොනිත්තාගත්තා. "ආයි..." නමුත් ඇය වේදනාව තද කරගත්තාය. මෙය සත්‍යකි. මෙය යථාර්තයයි. මේ ඇගේ ඉදිරියෙන් සිටින්නේ ඔහුම විය හැක.

ඒ අවුල් කොණ්ඩය එහෙම්ම අවුල් වෙලා තිබුණා...ඇස ගාව තිබුණු පුංචි තාරකාව (ඒ පුංචිම පුංචි උපන් ලපය එයා හැඳින්වූයේ එහෙම)...හිනාවෙද්දී වලගැහෙන කම්මුල්... ඒවා එහෙම්ම තිබුණා. ඔහුගේ දෑස් දිලිසුණා. ඒවා දීප්තිමත් විය.

ශවුර්යා අවුරුදු ගාණක් පුරාවටම මගබලාන හිටපු ඒ තරුණයා දැන් ඇය ඉදිරියේ සිටගෙන සිටී. ඔහු සෙමෙන් සෙමෙන් ටහම කටහඬ අවදි කලා.

" ශවුර්යා... මේ මම... " ඇය කිසිවක් කිව්වේ නෑ. නමුත් ශවුර්යාගෙ හිත කිව්වේම ඔහුව වැළඳගන්න කියලා. ඇය ඉන්න තැනින් සෙලවුනේවත් නෑ. ඇය හිටපු විදියටම ඉන්න තැනම හිටියා. ඇගේ කෙස් රොද සුළඟත් එක්ක දඟර කරන ආකාරය ඇය ඇස් කොනින් දැක්කා.

" ශවුර්යා... ඔ...ඔයාට මාව...ම...මතක නැද්ද... " ඔහු ආයෙමත් ඇහුවා. ඔහුගේ වචන පැටලුණි.

ශවුර්යාට මෙය සිහිනයක් විය. ඇයට මේ මොහොත දරාගන්නට නොහැකි වුණා. ඇය වටා සිය ගණනින් සිත්තරුන් සිටී. ඒත් ඇයට art exhibition එක ගැන පවා අමතක වී තිබුණා. පෙර ඇසුනු වයලීන් වාදනයද දැන් නැවතී ගොස්ය. ශවුර්යාට දැන් ඇහෙන්නේ හදවත ගැහෙන හඬ පමණි.

ඇය හෙමින් අඩියක් පිටිපස්සට තිබ්බා. ඇයට පිටිපස්සහ හැරිල දුවන්න හිතුණා. ඇය එතරම්ම නොසන්සුන්

විය. නමුත් ඇගේ තොල් යමක් පැවසීමට සෙලවුනද ඇය වචන ගිල ගත්තා.

නමුත් ඔවුන් දෙදෙනාට ඔවුන් දෙදෙනාවම අයෙත් පාරක් නැතිකරගන්න ඕන වුණේ නෑ. දෙන්නාගේම හදවත් කීවේ එක් දෙයක් පමණි. එනම් අලුත් ආරම්භයකි.

ඒත් එක්කම යුවාන් ශවුර්යාගේ අත අල්ලා ගටත්තා. ඔවුන් අතර වූයේ අඩියක් හෝ දෙකක පමණ දුරකි. ඔවුන්ගේඑ ඇස් එකිනෙකට ගැටුණා. දෙන්නාගෙන් එක් කෙනෙක්ටවත් ඇස් එහාට ගන්න ඕන වුනේ නෑ. ඔවුන්ගේ බැල්ම තීව්‍ර විය.

“ ශවුර්යා... ඔයා මෙච්චර කල් බලාන හිටියේ අද දවස වෙනකල් නෙමේද... එහෙම වෙලත් ඇයි ඔයා එක වචනයක්වත් කියන්නේ නැත්තේ... ” ඔහුගේ හඬ බිදෙනසුලු විය.

මේ ඉන්නේ අවුරුදු හතරකට කලින් accident වුණ යුවාන්ම තමයි. කිසිම වෙනසක් තිබුණේ නෑ... යුවාන් කලින් විදියටම හිටියා.

තත්පර කිහිපයක් ගතවිය... නෑ... තත්පර දශම ගාණක්...

එකායි... දෙකායි... තුනායි...

එක් නිමේෂයකින් ශවුර්යා ඔහුව වැළඳගත්තා. යුවානුත් ඇයව තදින් තුරුලු කරගත්තේ අවුරුදු ගානක් අහිමි වූ ඒ ආදරය දෙන්නා අතරේ බෙදාගන්න කියලා හිතාගෙන. ඔවුන්ට දැනුණේ අවුරුදු හතරකට කලින් අහිමි වූ ඔවුන්ගේම

ලෝකය දැන් ඔවුන් ඉදිරිපිට තියෙනවා වගේ. ශවුර්යාගේ ඇස්වලින් සතුටු කඳුළු කඩා වැටුණා. යුවාන්ගෙ ඇස්වලින් කවදාවත් කඳුළු කඩා හැලුණේ නැති වුණාට මෙවර ඔහුගේ කඳුළු ඔහුටත් හංගා ගන්න බැරිවුණා. හැමදාම යුවාන්ගෙන් හමන ඒ perfume සුවඳ තාමත් එහෙම්මම තිබුණා. යුවාන් ලග ඉන්නකොට ශවුර්යාට දැනුණේ සාම අතින්ම ආරක්ෂිත බවකි.

ඔව්... ඒ අවුරුද්දක් පුරාවටම ශවුර්යාට චිත්‍ර එවපු රහස් සිත්තරා යුවාන්ම තමයි. ශවුර්යා දන්නේ නැති වුණාට යුවාන් ඇය ගැන කාලයක් තිස්සේ හොයලා බලලා තිබුණා.

ඔවුන් දෙදෙනාගේ ආදරණීය වැළඳගැනීම ටිකවෙලාවකට ඇත්විය.

" ඇයි ඔයා මෙච්චර කාලයක් මට චිත්‍ර එවලත් ඒ ඔයා කියලා නිකන්වත් කිවේ නැත්තේ... මන් අවුරුදු ගාණක් පුරාවටම ඔයාව හෙව්වා... ඒත් මට ඔයාව හොයාගන්න බරිවුණා... ඒ දවසින් පස්සේ මන් එක චිත්‍රයක්වත් ඇන්දේ නෑ... ඒත් මන් ගොඩක් පුදුම වුණ කවුද මෙහෙම චිත්‍ර එවන්නේ කියලා... ඒ කොහොම වුණත්... දැන් ඔයා මන් ළඟ ඉන්නවානේ යුවාන්... මන් ආයේ කවදාවත් ඔයාව නැති කරගන්නේ නෑ... "

" මන් දන්නවා ශවුර්යා... " යුවාන් කිව්වේ ශවුර්යාගේ උරහිස් තම දෑතින්ම අල්ලාගෙන. " ලෙහාශා මට හැමදෙයක්ම කිව්වා. එක දවසක් මට England වලදී එක්කෙනෙක් ඇවිත් කතා කරා. ඒ තමයි ලෙහාශා. ඔයා එයාට පෙන්නපු පොටෝ එකක් නිසාලු එයා මාව අඳුරගෙන ඇවිල්ලා මට කතා කරේ. මන් මුලින්ම එයාව දැනගෙන හිටියේ නැති වුණාට එයාමට

ඔයාගැන හැමදෙයක්ම කිව්වා. පස්සේ පස්සේ මට ආයේ හැම දෙයක්ම මතක් වුණා. ලෙහාශා හම්බෙලා පහුවදාම මන් flight එකෙන් ලංකාවට ආවා. ඊට පස්සේ තමයි මන් එයාගෙන් ඔයාගේ address එක ඉල්ලන් ඔයාට චිත්‍ර එව්වේ. මන් ඔයාට මුලදීම කිසිම දෙයක් කිව්වේ නෑ තමයි ශවුර්යා. මන් හිතුවේ ඔයා මාව අමතක කරලා ඇති කියලා... ''

ශවුර්යා යුවාන් අත් තදින් අල්ලගත්තා. ශවුර්යා ඒ දෑත්වලින් දැනුණේ හුරුපුරුදු උණුසුමකි. නන්නාඳුනන්නාගේ වයලීන් වාදනය නැවත ඇරඹුණි. ජනෙල් කවුලු තුලින් ආ සුළඟ ඇයව රහසේම සිපගත්තා. ඇය අඩියක් ඉස්සරහට තිබ්බා. ඔහුද අඩියක් ඉස්සරහට ආවේ ඔහුටත් නොදැනීමය. ඔවුන් අතර වූයේ අඟල් කිහිපයක දුරකි. සිසිල් සුළඟ වාතලය කපාගෙන ඉදියීටම හමා ගියා.

යුවාන්ගේ අත ශවුර්යාගේ ඉණ වටා දිවුණි. ඔවුන් දෙදෙනාට දැනුණේ ඔවුන් තමන්ගේම ලෝකයක අතරමං වී ඇති බවකි. ශවුර්යා ඇඟිලි කුඩුවලින් තරමක් එසවුණි. දැන් ඔවුන් අතර වුයේ අඟල් කිහිපයක් පමණි. ඔවුන්ගේ දෙතොල් තවත් ළංවිය.

ඔවුන් දෙදෙනාගෙන් එක් කෙනෙකු හෝ හදිසි වුණේ නැත. ඔවුන් වටා ඇති ලෝකය පෙරට වඩා නිහඬ විය. ශවුර්යා සෙමෙන් දෑස් විවෘත කර යුවාන්ගේ දෑස් දිහා බැලුවා. ඔවුන් බෙදාගත් හැම මතකයක්ම ඒ ඇස්වල ගැබ්ව තිබුණි.

ඔහුගේ මුහුණේ කුඩා සිනා රැල්ලක් ඇඳී ගියා. ඇගේ දෑස්ද දිලිසුණි. ඔවුන්ගේ දෑස් පියවුණි. ඔවුන්ගේ තොල් කෙටි නමුත් මෘදු හාදුවකින් මුණ ගැසුණි. එය මෘදු උණුසුම් කිසිදා

පවසාගත නොහැකි වූ හැඟීම්වලින් පිරී තිබුණි. ඒ තත්පර දහයක් හෝ පහළොවක් පමණ වෙන්නැති. ඔවුන්ගේ දෙතොල් මදකට ඈත් විය. ඔවුන් දෙදෙනාම මොහොතකට නිහඬවිය. ඔවුන් දෙදෙනාගෙම සිතෙහි වූ දෙය දෙදෙනාම දැන සිටියහ.

අනාගතය අවිනිශ්චිත විය. අලුත් අභියෝග, අලුත් සිහින හා අලුත් මාර්ග නිර්මාණය වනු ඇත. ඔවුන් ඉදිරියේ සිදුවිය හැකි දේවල් ගැන බිය වූයේද නැත. මොන දේ සිදුවුවත් ඔවුන් යථාර්තය තේරුම් ගෙන තිබුණි.

නැවතත් ඔවුන්ගේ දෑඟිලි එකට පැටලුණි. ඔවුන් තමත් හිටියේ ඒ චිත්‍රය ඉදිරිපිටය. මොහොතකට ඔවුන් දෙදෙනාම නිහඬ විය. ඔවුන් කැන්වසය මත විහිදී තිබුණු වර්ණ දෙස නිහඬව බලා සිටියේ සෑම වර්ණයක් පසුපසම සැඟවුණු එයටම ආවේණික වූ කතාවක් ඇති බව දැන දැනමය.

" හරිම ලස්සනයි..." ඇය මෘදු හඬින් කිව්වා.

" නැහැ... ලස්සනම දේ මේක... " ඔහු සෙමෙන් කිවේ ඇගේ ඇස් දිහාම බලාගෙන.

සිතුවම් අතර තනි වූ ඒ නිමේශයට පමණක් ඔවුන් තමන්ගේම කතාවක් නිර්මාණය කර ඇති බව ඔවුන් වටහාගත්හ.

කැන්වසය හිස් වුවද, වර්ණ මැකී ගියද හදවතේ ඇඳුණු ඒ රූපය සදාකාලිකවම නොමැකෙන බව ඔවුන්ට දැන් වැටහී අවසන්ය. අමතක වූ මතක අතරින් පාර හොයාගෙන ආ ආදරය දැන් ඔවුන් ළඟම නතර වී තිබුණි. ඔව්... මේ අවර්ණ ජීවිතය වර්ණ ගැන්වීමට දැන් ඔවුන්ගේ මං විවර වී අවසන් ය.

*"හැම චිත්‍රයකටම අඩුපාඩු තියෙනවා...හැම ජීවිතේකටම වැරදුණු පාරවල් තියෙනවා...ඒත් ඇත්ත **artist** කෙනෙක් දන්නවා ඒ අඩුපාඩු හංගන්නේ නැතුව ඒවත් චිත්‍රයේම කොටසක් කරගන්න...ජීවිතෙත් එහෙමයි...අන්න ඒ නිසාම ඔයත් ඒ වගේ **artist** කෙනෙක් වෙන්න..."*

*නිමි...!*

** * **

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විදදායාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිරිර්මාතෘ)

# (අ)හිමි සිත්තම්

ආර්.එම්.සඳලි තාරකා රත්නායයක

ඇස් කියන්නේ මායාවක්...

ගලවගන්නම බැරි පැටලවිල්ලක්...

අපි හැමෝටම තිබුණා අමතක කරන්න බැරි ඇස් දෙකක්...

හදවත පසාරු කරගෙන යන බැල්මක්...

කලුපාට ඇසින් විතරක් දැනෙන උණුසුම්ම උණුසුම් හාදුවක්...

එක බැල්මකින් විතරක් කල්පගත මතක අවුස්සන ...

ඒ කලු පාට ඇස්...

ඇත්තටම චමත්කාරයි...!!!

